## විශේෂ සටහන 10
## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

**මුදල් ප්‍රතිපත්තිය**

| | |
|---|---|
| 2020 ජනවාරි 30 | - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.25 සහ සියයට 7.25 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. |
| | - බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, 2020 මාර්තු 16 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 5.00 සිට සියයට 4.00 දක්වා ප්‍රතිශතාංක 1කින් අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 03 | - 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.00 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 16 | - බැංකු අනුපාතිකය, සියයට 10.00 දක්වා පදනම් අංක 500කින් අඩු කළ අතර, පදනම් අංක +300ක ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී. |
| 2020 මැයි 06 | - 2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 5.50 සහ සියයට 6.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. බැංකු අනුපාතිකය සියයට 10.00 සිට සියයට 9.50 දක්වා ස්වයංක්‍රීයව අඩු විය. |
| 2020 ජූනි 16 | - 2020 ජූනි 16 වන දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 දක්වා ප්‍රතිශතාංක 2කින් අඩු කරන ලද අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සඳහා වන මුදල් ගැළපීම සියයට 2.00 සිට සියයට 1.00 දක්වා අඩු කරන ලදී. |
| 2020 ජූලි 09 | - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා පදනම් අංක 100කින් අඩු කරන ලදී. බැංකු අනුපාතිකය සියයට 9.50 සිට සියයට 8.50 දක්වා ස්වයංක්‍රීයව අඩු විය. |

**විශේෂ ණය යෝජනා ක්‍රම**

| | |
|---|---|
| 2020 ජනවාරි 27 | - අරමුදල් වෙන් කිරීම රුපියල් මිලියන 390 සිට රුපියල් මිලියන 950 දක්වාත්, ණය ගැනුම්කරුවකු සඳහා වන උපරිම ණය මුදල රුපියල් 500,000 සිට රුපියල් 1,000,000 දක්වාත් ඉහළ නැංවීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන ප්‍රාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර IIහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 පෙබරවාරි 25 | - අක්‍රීය ණය කාණ්ඩයට අයත් වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ලබා දෙන නව කාරක ප්‍රාග්ධන ණය සඳහා සියයට 75ක ඇප ආවරණයක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. |
| 2020 මාර්තු 27 | - කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා සියයට 4.00ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ, සමුච්චිත වටිනාකම රුපියල් බිලියන 50ක් වූ "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම" (අදියර I - ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය) යන සහනදායී ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. |
| 2020 අප්‍රේල් 01 | - කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ස්වයං රැකියා නියුක්තිකයන් සහ තනි පුද්ගල ව්‍යාපාර ඇතුළුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 88 වන වගන්තිය ප්‍රකාරව "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම" (අදියර I - ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය) ක්‍රියාත්මක කරන ලදී. |

1 2020 වසර තුළ දී සහ 2021 මාර්තු 31 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ. 2019 දෙසැම්බර් 01 වන දින සිට 2020 අප්‍රේල් 01 වන දින දක්වා කාලය තුළ දී රජය විසින් නිවේදනය කරන ලද (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන ලද) ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පාර්ලිමේන්තු අනුමැතියට යටත් වේ.

| | |
|---|---|
| 2020 අප්‍රේල් 06 | - සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි නොවූ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම" යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන ලෙස කටයුතු කිරීමේ අවස්ථාව ලබා දෙමින් මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2020 අප්‍රේල් 09 | - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) යටතේ, කෙටිකාලීන බෝග වර්ග 33ක් වගා කිරීමෙහි නියැලී සිටින සුළු පරිමාණ ගොවීන්ට සහාය දැක්වීමේ අරමුණින්, වාර්ෂික ණය පොලී අනුපාතය සියයට 7 සිට සියයට 4 දක්වා අඩු කිරීමටත්, "සරුසාර" ණය යෝජනා ක්‍රමයට "සෞභාග්‍යා" ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන හඳුන්වා දීම සඳහාත් සරුසාර ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 ජූනි 16 | - කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම"- අදියර II යටතේ, සියයට 4.00ක පොලී අනුපාතයකට 2020 මාර්තු 27 වන දින හඳුන්වා දෙන ලද සහනදායී ණය යෝජනා ක්‍රමය රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020 ජූනි 18 | - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීම සහතික කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරන ලද පොරොන්දු නෝට්ටු මත පදනම්ව භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඇප වශයෙන් තබා ගනිමින් සහනදායී ණය පොලී අනුපාතික යටතේ සපයන ලද අරමුදල් උපයෝගී කරගෙන කොන්ත්‍රාත්කරුවන්හට සියයට 4 නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතිකයකට ණය සැපයීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ විශේෂිත ද්‍රවශීලතා පහසුකමක් ලෙස ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වූ ද්‍රවශීලතා පහසුකම මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. |
| 2020 ජූනි 19 | - කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමේ අරමුණින්, මුදල් නීති පනතේ 83 වන වගන්තිය ප්‍රකාරව "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමෙහි" මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයක් ලෙස සෞභාග්‍ය කොවිඩ්-19 පුනරුද ණය පහසුකම - අදියර II හඳුන්වා දෙන ලදී. |
| 2020 ජූනි 24 | - බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන ණය අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2020 අගෝස්තු 31 දින දක්වා දීර්ඝ කිරීම සඳහා "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම" - අදියර I හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 ජූනි 30 | - අනෙක් අදියර වලදී සැපයූ පහසුකම් හා සමගාමීව, කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා මුදල් නීති පනතේ 108 වැනි වගන්තිය ප්‍රකාරව ණය ඇප ආවරණ සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් ලෙස "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම"- අදියර III ක්‍රියාත්මක කරන ලදී. |
| 2020 ජූලි 01 | - මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමත් සමඟ "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලී අනුපාතිකය සියයට 8.00 සිට සියයට 6.00 දක්වා අඩු කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 ජූලි 16 | - "ස්වශක්ති - රැකියා දසලක්ෂයක් කරා" ණය යෝජනා ක්‍රමයේ උපරිම ණය මුදල රුපියල් 250,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කිරීමට මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2020 ජූලි 24 | - ඉදිකිරීම්, ඖෂධ හා හඳුනාගත් එවැනි අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ හා සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීම සහතික කිරීම සඳහා, රජය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඇප වශයෙන් තබා ඉදිරිපත් කළ පොරොන්දු නෝට්ටු මත පදනම්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත විශේෂිත ද්‍රවශීලතා පහසුකමක් ලෙස හඳුන්වා දෙන ලද ද්‍රවශීලතා පහසුකම, ඉදිකිරීම්, ඖෂධ හා හඳුනාගත් එවැනි අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් සඳහා පුළුල් කරන ලදී. |
| 2020 අගෝස්තු 25 | - සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් භාර දීමේ අවසාන දිනය 2020 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කිරීම සඳහා "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම"ට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 නොවැම්බර් 03 | - ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය 4P, ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය 4P, මූල්‍ය අතරමැදි තොග ණය යෝජනා ක්‍රමය 4P, ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය (චක්‍රීය අරමුදල), ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය (චක්‍රීය අරමුදල), මූල්‍ය අතරමැදි තොග ණය යෝජනා ක්‍රමය (චක්‍රීය අරමුදල) සහ තේ සහ රබර් අංශය සඳහා වූ ණය යෝජනා ක්‍රමය (චක්‍රීය අරමුදල) යන නව ණය යෝජනා ක්‍රම 7ක් හඳුන්වා දීම සඳහා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |

**මූල්‍ය අංශය**

**බලපත්‍රලාභී බැංකු**

| | |
|---|---|
| 2020 ජනවාරි 30 | - සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන්ට ණය ආධාර සැපයීම සඳහා විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් බලපත්‍රලාභී බැංකු (බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු) වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 01 | - අපනයන ආදායමෙන් අපනයන ණය පහසුකම් පියවීම සඳහා ගත වන උපරිම කාලය, නැව්ගත කළ දින සිට දින 180ක් දක්වා දීර්ඝ කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 19 | - ණයවර ලිපි යටතේ තෝරාගත් මෝටර් වාහන ආනයනය කිරීම සහ ණයවර ලිපි, ප්‍රතිග්‍රහණ ලියවිලි හා අත්තිකාරම් ගෙවීම් යටතේ තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම අත්හිටුවන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. තව ද, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම මාස තුනක කාලයක් සඳහා අත්හිටුවන ලදී. |
| 2020 මාර්තු 24 | - කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා සහන සැලසීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කළ විධානය සහ කැබිනට් අමාත්‍ය මණ්ඩල තීරණයට සමගාමීව, බලපත්‍රලාභී බැංකු විසින් මේ සම්බන්ධයෙන් ලබා දිය යුතු සහන ක්‍රියාමාර්ග දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 27 | - කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් බලපෑමට ලක් වූ ස්වයං රැකියාවල නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් ඇතුළුව ව්‍යාපාර සඳහා සහාය දැක්වීමට 2020 මාර්තු 25 සිට ක්‍රියාත්මක වන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගී වීමට අවශ්‍ය සුදුසුකම් දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2020 මාර්තු 24 දින නිකුත් කළ 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකව වන අතර, ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් මාර්ගෝපදේශ මෙමගින් සපයනු ලැබේ. |
| | - දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සහ අනෙකුත් බැංකු සඳහා ඔවුන්ගේ ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂ මට්ටම් පහත දැමීමට අවසර දීම, 2020 මාර්තු මස තුළ දී ගෙවීමට නියමිතව තිබූ ණය පියවීම සඳහා දින 60ක කාලයක් ලබා දීම, විදේශ මුදලින් පියවීමට ඇති ණය රුපියල්වලට හරවා පියවා ගැනීමට අවසර දීම සහ 2020 වසර අවසානය වන විට ඉහළ නැංවිය යුතුව තිබූ අවම ප්‍රාග්ධන අවශ්‍යතා 2020 අවසන් වන විට සපුරා නොමැති බැංකු හට ඒ සඳහා 2022 වසර අවසානය තෙක් කල් ලබා දීම සඳහා මහ බැංකුව විසින් සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. |
| 2020 අප්‍රේල් 17 | - 2020 අප්‍රේල් 16 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් දෛනිකව මහ බැංකුවේ පවත්වා ගත යුතු අවම තැන්පතු (සංචිත) අවශ්‍යතාව, ඕනෑම දිනක දී පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක් වූ පෙර පැවති අවශ්‍යතාවයේ සිට සියයට 20 දක්වා අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 27 | - පුද්ගලික ස්වර්ණාභරණ ඇප ලෙස තබා ගන්නා උකස් අත්තිකාරම් සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාතය දැනුම් දෙමින් මුදල් නීති පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 මැයි 05 | - ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීම සඳහා, කොන්දේසිවලට යටත්ව, ඇතැම් වත්කම් ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට බලපත්‍රලාභී බැංකුවලට අවසර දෙමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. වැඩිදියුණු කරන ලද නියාමන සහ නිරන්තර වාර්තාකරණයන්ට යටත්ව, 2021 ජූනි 30 දක්වා ද්‍රවශීලතා ආවරණ අනුපාතය හා ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය සඳහා වන අවම අවශ්‍යතා මට්ටම සියයට 90 දක්වා අඩු කරන ලදී. |
| 2020 මැයි 13 | - බලපත්‍රලාභී බැංකුවල මුදල් ප්‍රවාහ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සහ ද්‍රවශීලතා යෝග්‍ය මට්ටමින් පවත්වාගෙන යෑම තහවුරු කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලද අතර ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල මුදල් ලාභාංශ ගෙවීම, ලාභ මෙරටින් බැහැර කිරීම, තම කොටස් ආපසු මිලට ගැනීම, කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට කරනු ලබන දීමනා ඉහළ දැමීම වැනි කටයුතු තාවකාලිකව සීමා කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරන ලදී. තවද, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසත් අත්‍යාවශ්‍ය නොවන වියදම් සිදු කිරීමෙන් හැකිතාක් දුරට වළකින ලෙසත් දැනුම් දෙන ලදී. |

2020 මැයි 15
- මෝටර් රථ මිලදී ගැනීම සඳහා ලබා දෙන ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාතික පිළිබඳ පෙර පැවති බැංකු පනත් විධාන වෙනුවට නව බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2020 ජූනි 19
- බැංකු වෙත ලැබෙන නව විදේශ මුදල් මගින් හැර අනෙකුත් ආකාරයේ අරමුදල් භාවිතයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදු කරන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2020 ජූනි 19 වන දින සිට මාස තුනක කාලයක් සඳහා අත්හිටුවමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී.

2020 ජූලි 16
- රජය විසින් 2020 දෙසැම්බර් 31 වන දින දක්වා කාලය තුළ දී "කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු හිඟ බිල්පත් සඳහා නිකුත් කර ඇති ප්‍රතිග්‍රාහක ලිපි" මත පදනම්ව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්කරුවන් වෙත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති නව ණය පහසුකම්, 2020 දෙසැම්බර් 31 දින දක්වා සියයට 10ක ආන්තිකයක් සහිතව ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත ගණනය කිරීමේ දී ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දෙමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. මෙම හිඟ බිල්පත් සඳහා නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපි සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය පහසුකමෙහි අදියර III යටතේ ලබා දුන් ණය ඇපකර, එම ණය පහසුකම් සඳහා වන ණය අවදානම අවම කිරීමේ උපකරණ ලෙස සැලකීමටත්, ඒ අනුව ඒවා සියයට බිංදුවක අවදානම මත බර තැබීමටත් අවසර ලබා දෙන ලදී.
- සංචාරක ක්ෂේත්‍රයේ නිරත රථවාහන සඳහා ලබා දී ඇති කල්බදු පහසුකම්වල අයවිය යුතු හිඟ ඇති ප්‍රාග්ධන ප්‍රමාණ සඳහා දැනට ලබා දී ඇති ණය සහන කාල සීමාව 2021 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙහි දී මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන් අපහසුතාවයට ලක් නොවන ආකාරයෙන් ණය සහන කාලසීමාවට අදාළ පොලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ හැකි අතර, එකී ගනුදෙනුකරුවන්ගේ එකතු වී ඇති නොගෙවූ දඩ පොලී කපා හැරීමට කටයුතු කළ යුතු විය. තව ද, මෙම ණය සහන කාලය තුළ සමාන වටිනාකමින් යුතු වාරික ණය හා පොදු ප්‍රවාහන පහසුකම් සපයන බස් රථ සඳහා ලබා දී ඇති කල්බදු පහසුකම් සම්බන්ධයෙන් අය කළ හැකි උපරිම අමතර පොලී අනුපාතය සහ එම අමතර පොලී අය කළ යුතු ආකාරය පිළිබඳ බලපත්‍රලාභී බැංකු දැනුම්වත් කරන ලදී.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සැලකිය හැකි උපරිම පිරිවැටුම් සීමාව රුපියල් බිලියන 1 දක්වා ඉහළ දමමින්, බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී.

2020 අගෝස්තු 21
- වෙළඳපොළ පොලී අනුපාත පහත දැමීම හා සමගාමීව රුපියල්වලින් නාමිත ණය කාඩ්පත්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික අයිරා, උකස් අත්තිකාරම් සඳහා අය කළ හැකි උපරිම පොලී අනුපාත, සියලුම ණය සහ අත්තිකාරම් සඳහා අය කළ හැකි දඩ පොලී අනුපාත සහ අපනයනකරුවන් සඳහා ලබා දෙන අත්තිකාරම් සඳහා අය කළ හැකි අමතර පොලී අනුපාත සඳහා වන උපරිම සීමාවන් දක්වමින් මුදල් නීති පනත් විධානයක් නිකුත් කරන ලදී.

2020 අගෝස්තු 26
- කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන කාලය 2020 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාස 6ක කාලයක් සඳහා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 08
- වසර 10ක් තුළ දී කොටස් හිමිකාරිත්වය සියයට 15 දක්වා පහත දැමීමේ කොන්දේසියට යටත්ව, සියයට 20ක් නොඉක්මවූ ප්‍රාමාණික හිමිකමක් අත්පත් කර ගැනීමට අවසර ලබා දීම සඳහා බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන විසින් බලපත්‍රලාභී බැංකුවල ඡන්ද අයිතිය හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ ප්‍රාමාණික හිමිකමක් අත්පත් කර ගැනීම සඳහා තිබූ සීමා සංශෝධනය කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 30
- ආමුඛ ආයෝජන හුවමාරු ගිවිසුම් (Inward Investment Swaps) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා අදාළ පොදු කොන්දේසි හා නියමයන් සංශෝධනය කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2020 ඔක්තෝබර් 28
- කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින් ලබා ගත් ණය වර්ගීකරණය සඳහා සැලකීමේ දී, ගනුදෙනුකරුවකුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව අවස්ථානුකූලව සලකා බලා තීරණය කිරීමේ හැකියාව බලපත්‍රලාභී බැංකු වෙත ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9: මූල්‍ය උපකරණ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නිකුත් කර තිබූ චක්‍රලේඛය සංශෝධනය කරමින් නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

| | |
|---|---|
| 2020 නොවැම්බර් 09 | - කොවිඩ්-19 දෙවන ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින්, 2020 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලයක් සඳහා ණය සහන කාල සීමාව දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 නොවැම්බර් 12 | - බලපත්‍රලාභී බැංකු සඳහා 2020 වසරට අදාළ වාර්ෂික බලපත්‍ර ගාස්තු ව්‍යුහය, 2021 වර්ෂය සඳහා ද නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය කළ තීරණය දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. |
| 2020 දෙසැම්බර් 04 | - දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය සහ ඒ ආශ්‍රිත සැපයුම් දාමයන්ට අමතර උත්ප්‍රේරකයක් සැපයීමේ සහ මෙරට ජනතාවගේ නිවාස හිමිකම් පුළුල් කිරීමේ අරමුණින් රජයේ සහ පුද්ගලික අංශයේ වැටුප් ලබන සේවකයන් විසින් දේපළ ඇප ලෙස තබා ගන්නා නිවාස උකස් ණය සඳහා අය කළ හැකි උපරිම වාර්ෂික පොලිය සියයට 7කට සීමා කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2020 දෙසැම්බර් 11 | - බැංකු වෙත ලැබෙන නව විදේශ මුදල් මගින් හැර අනෙකුත් ආකාරයේ අරමුදල් භාවිතයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදු කරන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2020 දෙසැම්බර් 11 දින සිට මාස හයක කාලයක් සඳහා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2020 දෙසැම්බර් 23 | - බලපත්‍රලාභී බැංකු විසින් ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම වෙත ලැබෙන අරමුදල් උපයෝගි කරගනිමින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම හේතුකොට ගෙන, මෙරට විදේශ විනිමය වෙළඳපොළ මත ඇති වන අනවශ්‍ය පීඩනය පිළිබඳව සලකමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම මාස තුනක කාලයකට අත්හිටුවමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. ඒ අනුව, 2020 දෙසැම්බර් 11 දින නිකුත් කරන ලද බැංකු පනත් විධාන අවලංගු කරන ලදී. |
| 2020 දෙසැම්බර් 31 | - බලපත්‍රලාභී බැංකුවල තක්සේරුකරුවන්ගේ සුදුසුකම් පිළිබඳ නිර්ණායක පුළුල් කරමින්, බලපත්‍රලාභී බැංකුවල නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා පවතින නියාමන රාමුව සංශෝධනය කිරීම සඳහා බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2021 ජනවාරි 13 | - වසංගත තත්ත්වය හමුවේ, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට සහන සැලසීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට සමගාමීව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව ගනු ලබන ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග මාස හයක කාලයකට අත්හිටුවන ලෙස දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කෙරිණ. |
| 2021 ජනවාරි 19 | - බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම්වලට පනවා තිබූ සීමා කිරීම් ලිහිල් කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල විගණන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැර කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. තව ද, 2021 ජූනි 30 දක්වා සිය කොටස් ආපසු මිලට ගැනීමෙන් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ දැමීමෙන් වැළකී සිටින ලෙස බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දුන් අතර, ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලදී. |
| 2021 ජනවාරි 25 | - බලපත්‍රලාභී බැංකු විසින් 2021 වසර සඳහා අපේක්ෂිත අලාභ ගණනය කිරීමේ දී, රජය විසින් නිකුත් කරන ලද, විදේශ මුදලින් නාමනය කරන ලද, මූල්‍ය උපකරණ සඳහා ඇති නිරාවරණයන්ගේ ණය පැහැර හැරීමක දී විය හැකි ඇස්තමේන්තුගත අලාභ සියයට 10ක් දක්වා පහත දමමින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9: මූල්‍ය උපකරණ ක්‍රියාවට නැංවීම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංශෝධනය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | - 2021 වසර සඳහා රජය වෙතින් අය වීමට ඇති, විදේශීය මුදලින් ගෙවීම් සඳහා වන බර තැබීම් සියයට 20 සිට 10 දක්වා සහ උකස්කර මත ලබා දී ඇති නිවාස ණය සඳහා අදාළ බර තැබීම සියයට 50 සිට සියයට 35 දක්වා අඩු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| | - විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින අධි විචලතාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින්, වහාම ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයක් සඳහා විදේශ මුදල් ඉදිරි ගිවිසුම් සඳහා එළඹීමෙන් වළකින ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 10 | - කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ, මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු (ලීසිං) පහසුකම් සඳහා 2021 අප්‍රේල් 01 දින සිට මාස හයක ණය සහන කාලයක් ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| 2021 මාර්තු 18 | - බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය විශාල වශයෙන් පිටතට ගලා යාමට ඇති හැකියාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාත මත ඇති විය හැකි පීඩනය පිළිබඳව සලකමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් සිදු කරන ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2021 මාර්තු 23 දින සිට 2021 අප්‍රේල් 09 දක්වා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 19 | - කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 අප්‍රේල් 01 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ගනුදෙනුකරුවන් විසින්, මෙම දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමට පෙර, සිය ණය පහසුකම් දිගු කාලීනව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සැපයීම මෙමගින් අපේක්ෂා කෙරේ. |
| අපේක්ෂිත | - නව බැංකු පනත කෙටුම්පත් කිරීම<br>- බලපත්‍රලාභී බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාවට නැංවීම<br>- බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණ අවදානමට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපනය කිරීම<br>- ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් නිර්ණය සහ වෙන් කිරීම් සඳහා වන නියාමන සහ ගිණුම්කරණ රාමුව ඒකාබද්ධ කිරීම<br>- තිරසාර මූල්‍යකරණය සඳහා බැංකු අංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අදාළ පහසුකම් සැලසීම |

**බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | |
|---|---|
| 2020 පෙබරවාරි 14 | - වරලත් ගණකාධිකාරීවරුන්ගේ සභාව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09: මූල්‍ය උපකරණ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම්කරණය පිළිබඳ අවම අවශ්‍යතා සහිත විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 පෙබරවාරි 17 | - වරලත් ගණකාධිකාරීවරුන්ගේ සභාව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09: මූල්‍ය උපකරණ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම්කරණය පිළිබඳ අවම අවශ්‍යතා සහිත විධානයක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 10 | - ආදායම් උත්පාදනය කරනු ලබන ක්‍රියාකාරකම් හි නිරත සුදුසුකම්ලත් පුද්ගලයන් සහ ආයතන සඳහා ණය ආධාර සැපයීමට විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 24 | - කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා බලපෑමට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 27 | - කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා බලපෑමට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා 2020 මාර්තු 24 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට අතිරේකව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 මාර්තු 31 | - බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වාගෙන යා යුතු ද්‍රවශීල වත්කම් සම්බන්ධයෙන් පවතින විධානය සංශෝධනය කරමින් නව විධානයක් නිකුත් කරන ලද අතර එය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා බලපැවැත්වේ. |
| 2020 අප්‍රේල් 24 | - දේශීයව එකලස් කරනු ලබන මෝටර් රථ, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සහ වෑන් රථ සඳහා වන වටිනාකම් මත ණය අනුපාතය ඉහළ නැංවීම සඳහා අවසර ලබා දෙමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර ඇති වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කරන ලදී.<br>- බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල තැන්පතු සහ ණය උපකරණ මත වන උපරිම පොලී අනුපාත සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධානය, අදාළ පොලී අනුපාත සුළු වශයෙන් අඩු කරමින් සංශෝධනය කරන ලදී. |

| | |
|---|---|
| 2020 ජූනි 18 | - දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරනු ලබන සහ වයස අවුරුදු 70 සම්පූර්ණ වූ බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකුට, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව තම ධූරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යාම සඳහා අවසරය ලබා දෙමින් ආයතනික යහපාලන විධානය සංශෝධනය කර බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 26 | - දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරනු ලබන සහ වයස අවුරුදු 70 සම්පූර්ණ වූ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක අධ්‍යක්ෂවරයෙකුට, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව තම ධූරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යාම සඳහා අවසරය ලබා දෙමින් ආයතනික යහපාලන විධානය සංශෝධනය කර විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූලි 16 | - අනුමත කිරීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම, නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට සැලසුම් කිරීමේ දී අවශ්‍ය අවම නිර්ණායක සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත වගකීම් පැවරීම, අවම වශයෙන් පවත්වා ගත යුතු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් සකස් කිරීම සහ පවත්නා අනෙකුත් සේවා ස්ථාන ප්‍රමිතිකරණය කිරීම යන මූලික කරුණු ඇතුළත් කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත "ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම්" යන නමින් විධානයක් නිකුත් කරන ලදී. |
| | - 2020 මාර්තු 27 දින නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛයට අනුව සංචාරක කර්මාන්තයට අදාළ රථ වාහන සඳහා ලබා ගෙන ඇති කල්බදු පහසුකම්වල මුල් මුදල ගෙවීම සඳහා ලබා දී තිබූ මාස 06ක සහන කාල සීමාව තවත් මාස 06කින් දීර්ඝ කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූලි 30 | - මාස 12කට වැඩි කාලයකින් කල් පිරෙන ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර (ලියමකින් හෝ බැඳීමකින් නිදහස්) සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ලියමකින් හෝ බැඳීමකින් නිදහස්) ද්‍රවශීල වත්කම් ලෙස ඇතුළත් කරමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය යටතේ ද්‍රවශීල වත්කම් අර්ථ දැක්වීම සංශෝධනය කරන ලදී. |
| 2020 අගෝස්තු 20 | - අනුමත කිරීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම, නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට සැලසුම් කිරීමේ දී අවශ්‍ය අවම නිර්ණායක සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත වගකීම් පැවරීම, අවම වශයෙන් පවත්වා ගත යුතු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් සකස් කිරීම සහ පවත්නා අනෙකුත් සේවා ස්ථාන ප්‍රමිතිකරණය කිරීම යන මූලික කරුණු ඇතුළත් කරමින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත "ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම්" යන නමින් විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 28 | - බලපත්‍රලාභී මුදල් සමාගම්වල නිල වෙබ් අඩවියේ සහ පුවත්පත්වල භාෂා ත්‍රිත්වයෙන්ම මූල්‍ය තොරතුරු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක පළ කිරීම සඳහා හඳුන්වා දුන් නව ආකෘතිය අනුගමනය කරන ලෙසට සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී. තව ද, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තම නිල වෙබ් අඩවියේ ස්වාධීන විගණන වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ණය ශ්‍රේණිගත කිරීමේ වාර්තා භාෂා ත්‍රිත්වයෙන්ම පළ කළ යුතුය. |
| 2020 සැප්තැම්බර් 30 | - කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා ලබා දී තිබූ ණය සහන කාලසීමාව 2020 ඔක්තෝබර් 01 දින සිට මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය හඳුන්වා දීමත් සමඟම 2020 ජූලි 16 දිනැති චක්‍රලේඛය අවලංගු කරන ලදී. |
| | - 2020 මාර්තු 31 දින නිකුත් කරන ලද, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානය සංශෝධනය කරමින් එය බලපැවැත්වෙන කාලය 2021 මාර්තු 31 දක්වා තවත් මාස හයකින් දීර්ඝ කරන ලදී. |
| 2020 නොවැම්බර් 09 | - කොවිඩ්-19 දෙවන ව්‍යාප්තිය හේතුවෙන් ව්‍යාපාර හා පුද්ගලයන් මුහුණ දුන් අභියෝග සැලකිල්ලට ගනිමින්, කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ණය සහන සැලසීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| 2020 නොවැම්බර් 27 | - ණය සහන ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු කාල සීමාව දීර්ඝ කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත අදාළ උපදෙස් ලබා දෙමින් 2020 නොවැම්බර් 09 දින නිකුත් කරන ලද චක්‍රලේඛය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| 2020 නොවැම්බර් 30 | - වඩා හොඳ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ භාවිතයන් තුළින් මූල්‍ය ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවක් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිකුත් කරන ලදී. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවන්, ප්‍රාග්ධන සීමාවන් වැනි ඇතැම් ප්‍රාග්ධනය පදනම් කරගත් ප්‍රේරක සඳහා අදාළ වන අවම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන්, කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුවෙහි ඇතුළත් වේ. |
| | - 2022 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍රලාභී මුදල් සමාගම් හි හිමිකම් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශත සීමාවන් දක්වමින් විධානයක් නිකුත් කරන ලදී. ඕනෑම කොටස් හිමියෙකු විසින් ඍජුව හෝ වක්‍රව ඡන්ද අයිතිය දරන කොටස් රඳවා තබා ගැනීමේ උපරිම සීමාව 2033 දෙසැම්බර් 31 දින වන විට, බලපත්‍රලාභී මුදල් සමාගමේ ඡන්ද අයිතිය දරන නිකුතු ප්‍රාග්ධනයෙන් සියයට 50 දක්වා කොටස් වශයෙන් අදියර දෙකක දී අඩු කළ යුතුය. |
| 2020 දෙසැම්බර් 23 | - ආයතනික යහපාලනය සම්බන්ධයෙන් යෝජිත විධානය පිළිබඳ උපදේශන පත්‍රිකාවක් නිකුත් කරන ලදී. |
| 2021 ජනවාරි 01 | - තක්සේරුකරුවන් සඳහා සුදුසුකම් නිර්ණායකයන් සංශෝධනය කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිශ්චල දේපළ තක්සේරු කිරීමේ විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| 2021 පෙබරවාරි 17 | - ශ්‍රී ලංකාව තුළ පළමු ලියාපදිංචියෙන් වසරකට වැඩි කාලයක් භාවිත කර ඇති ලියාපදිංචි මෝටර් රථ වාහන සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී වටිනාකම් මත ණය අනුපාතය සියයට 80ක් ලෙස සංශෝධනය කරමින් වටිනාකම් මත ණය අනුපාත විධානය සඳහා සංශෝධනයන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 12 | - කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා 2021 අප්‍රේල් 01 දින සිට මාස 6ක කාලයක් සඳහා ණය සහන ලබා දෙන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 19 | - 2020 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය යටතේ සංචාරක අංශයට ලබා දී ඇති ණය සහනය 2021 අප්‍රේල් 01 දින සිට තවත් මාස 6ක කාලයක් සඳහා දීර්ඝ කරන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 31 | - 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම්කරණයට අදාළ විධානය ක්‍රියාත්මක කිරීම මාස තුනකින් කල්දැමීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දැනුම් දෙන ලදී. |
| | - කොවිඩ්-19 වසංගතයේ දිගුකාලීන බලපෑම හේතුවෙන් නිර්මාණය වූ අභියෝගාත්මක වාතාවරණය තුළ ද්‍රවශීලතා මට්ටම් සඳහා ඇති විය හැකි පීඩනය මඟහරවා ගැනීම සඳහා පහසුකම් සැලසීමට 2020 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානයේ සංශෝධනය, 2021 ජූනි 30 දක්වා මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරමින් විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සංශෝධනය කිරීම |
| | - 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කිරීම සහ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරවල මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් විධානයක් නිකුත් කිරීම |
| | - ආයතනික යහපාලනය පිළිබඳ පවත්නා විධානය සංශෝධනය කිරීම |
| | - විද්‍යුත් මුදල් පද්ධතිය සහ ජංගම ගෙවීම් පද්ධතිය ඇතුළුව මූල්‍ය තාක්ෂණික පද්ධතිය සඳහා පහසුකම් සැලසීම සඳහා විධානයන් හඳුන්වා දීම |
| | - වත්මන් වෙළඳපොළ සංවර්ධනයන්ට සමගාමීව පවත්නා විධාන සංශෝධනය කිරීම සහ නියාමනයන් අවශ්‍ය ක්ෂේත්‍ර සඳහා නව විධාන නිකුත් කිරීම |
| | - ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත බලාත්මක කිරීම සහ එම පනත හා සමගාමීව නියාමන රාමුව සංවර්ධනය කිරීම |
| | - විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතීන් සහිත, අවම මට්ටමට වඩා ඉහළින් විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල වන, ප්‍රශස්ත සහ හොඳින් ක්‍රියාත්මක වන බලපත්‍රලාභී මුදල් සමාගම් 25ක් මැදි කාලයේ දී ස්ථාපිත කිරීම සඳහා පස් අවුරුදු ඒකාබද්ධ කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම |

**රක්ෂණය**

2020 පෙබරවාරි 19 - ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහාය යටතේ පාරිභෝගික අධ්‍යාපන උපායමාර්ගය ක්‍රියාත්මක කරන ලදී.

2020 පෙබරවාරි 25 - 2017 ජූලි 05 දිනැති අතිවිශේෂ ගැසට් අංක 2026/27හි ප්‍රකාශයට පත් කරන ලද 'අලාභ ගැලපුම් සේවා ලියාපදිංචි කිරීමේ රීති' පිළිබඳ 42 වන චක්‍රලේඛය නිකුත් කිරීම මගින් බලපත්‍ර රහිත අලාභ ගැලපුම්කරුවන්ගෙන් අලාභ ගැලපුම් සේවා ලබා ගැනීමෙන් වැළකී සිටින ලෙසට සියලුම රක්ෂණ සමාගම් වෙත නියම කරන ලදී.

2020 අප්‍රේල් 11 - කොවිඩ්-19 වසංගතය අතරතුර ක්‍රියාත්මක කළ සහන ක්‍රියාමාර්ග:

- රක්ෂණ ඔප්පු හිමියන්ට සහනයක් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිරිගැන්වීමක් ලෙස හඳුන්වා දුන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටස් හිමියන්ට පළමු හා අවසාන ලාභාංශ ගෙවීම අත්හිටුවීම අධීක්ෂණය කරන ලදී.
- 2020 මාර්තු 01 සිට 2020 ජූනි 30 දක්වා ප්‍රතිරක්ෂණ ලබා දී ඇති රක්ෂණ ඔප්පු සඳහා සමාගම් නිලධාරියෙකුගේ නිශ්චිත තහවුරු කිරීමකට යටත්ව, නුබුන්වත් කටයුතු සඳහා දින 90ක් දක්වා හිඟ වාරික සලකා බැලීමට දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සමාගම්වලට අවසර දෙන ලදී.
- රක්ෂකයා/රක්ෂණ සමාගමේ අදාළ නිලධාරියා විසින් සපයනු ලබන "අවදානම් පදනම් කර ගත් ප්‍රාග්ධන අවශ්‍යතා (උදා:- ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය, පවතින සමස්ත ප්‍රාග්ධනය සහ අවශ්‍ය අවදානම් ප්‍රාග්ධනය) සහ නියෝග අංක 01 දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා දක්වන අනුකූලතාවය" 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාසයේ සිට සමීපව අධීක්ෂණය කරන ලදී.
- 2015 වසරේ දී ගැසට් කරන ලද රීතිවලට අනුව අවදානම් ගණනය කිරීම සඳහා දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් අවදානම් රහිත පොලී අනුපාතය (Risk Free Interest Rate - RFR) භාවිතා කර තිබේද යන්න අධීක්ෂණය කරන ලදී.

2020 ජූනි 03 - තැරැව්කාර සමාගම් ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා දීර්ඝ කාලයක් ගන්නා විට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලබන බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සඳහා "අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල වීම" යන 19 වන විධානය සංශෝධනය කරන ලදී.

2020 ජූනි 08 - ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සහ රක්ෂණ ආයතන කිහිපයක අදහස් ඇතිව රක්ෂණ සමාගම් සඳහා ආයතනික යහපාලන රාමුව පිළිබඳව 17 වන විධානය සංශෝධනය කරන ලදී.

2020 ජූලි 02 - රක්ෂණ ඔප්පුහිමියන් විසින් ප්‍රතිපත්ති නියමයන් සහ කොන්දේසි අවබෝධ කර ගැනීම සහතික කිරීම සඳහා සියලුම රක්ෂණ සමාගම් විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම රක්ෂණ ඔප්පු නිකුත් කරන ලෙස චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 22 - මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියට (Financial Sector Modernisation Project - FSMP) අදාළව පවරා ඇති ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

2020 ඔක්තෝබර් 05 - නියෝජිතයන්ට සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී සියලුම රක්ෂණ සමාගම්/තැරැව්කරුවන් විසින් පිළිපැදිය යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳව මඟපෙන්වීමක් නිකුත් කිරීම.

2020 ඔක්තෝබර් 14 - ජංගම දුරකථන ජාල/ස්ථාවර ජාල ක්‍රියාකරුවන් හරහා රක්ෂණ ඔප්පු විකිණීම පිළිබඳව හෝ ඒ හා සම්බන්ධ වෙනත් ගැටලු පිළිබඳව තම පැමිණිලි සහ/හෝ මතයන් ඉදිරිපත් කරන ලෙස මහජනතාව, ඔප්පු හිමියන් හෝ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා පුවත්පත් නිවේදනයක් ප්‍රකාශයට පත් කරන ලදී.

අපේක්ෂිත - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) හා සම්බන්ධ කටයුතු අඛණ්ඩව සිදු කිරීම

- මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයට (National Financial Inclusion Strategy - NFIS) අදාළ නියම කර ඇති කටයුතු ක්‍රියාත්මක කිරීම

**ප්‍රාග්ධන වෙළඳපොළ**

2020 පෙබරවාරි 12 - සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින්, කොටස් ලැයිස්තුගත කිරීමට අදාළ සුදුසුකම් නිර්ණායක පුළුල් කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ නීති සංශෝධනය කරන ලදී. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධව, ප්‍රථමවරට ආයතන ලැයිස්තුගත කිරීම පාලනය කිරීමේ නියාමන රාමුව පුළුල් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලදී.

**2020 මාර්තු 31**

- සියලුම ලියාපදිංචි ආන්තික සැපයුම්කරුවන්ගේ හා සියලුම බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ගේ ගනුදෙනුකරුවන්ට, 2020 මාර්තු 11 දින සිට බලපැවැත්වෙන පරිදි ණය සඳහා පොලිය ගෙවීමේ දී ණය සහනයක් පිරිනමා ඇත.
- කොටස් තැරැව්කරුවන්/බෙදාහරින්නන් විසින් සිදු කරන ලද ණය නිරාවරණය අධීක්ෂණය කිරීම සඳහා වන නියාමන පියවරයන් අනුගමනය කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

**2020 අප්‍රේල් 30**

- කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතන සඳහා වන වාර්තා ඉදිරිපත් කිරීමේ කාලසීමාව දීර්ඝ කරන ලදී.
- 2020 වසර සඳහා සියලුම බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතන විසින් මූලික නියාමන ක්‍රියාකාරකම්වලට අදාළව ගෙවිය යුතු සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට වාර්ෂික ගෙවිය යුතු බලපත්‍ර/ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම වසරකින් කල් දමන ලදී.
- කොටස් වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා සහ S&P SL 20 දර්ශකයේ විෂමතා ඉවත් කිරීම සඳහා පූර්වාරක්ෂක පියවරයන් තහවුරු කිරීමට ත්‍රිත්ව පෙළ පරිපථ ඛණ්ඩන ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී.

**2020 ජූලි 31**

- දේපළ වෙළඳාම් ආයෝජන භාර (Real Estate Investment Trusts - REITs) හඳුන්වා දීම සඳහා වන නීති ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

**2020 සැප්තැම්බර් 09**

- ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධතියේ මිල වෙනස්වීම්වල අවමය (tick size) සංශෝධනය කරන ලදී.

**2020 සැප්තැම්බර් 14**

- සවිබලගැන්වීමේ පුවරුවට අදාළ වන ලැයිස්තුගත කිරීමේ නීති තවදුරටත් ලිහිල් වන සේ සංශෝධනය කරන ලදී.

**2020 සැප්තැම්බර්**

- කොළඹ කොටස් හුවමාරුවේ ඩිජිටල්කරණය අවසන් කිරීමේ පළමු අදියර යටතේ පහත සඳහන් මූලික පියවර සිදු කරන ලදී.
  - ලියකියවිලි මත පදනම් වූ කොටස් වෙළඳපොළ කටයුතු, ඉලෙක්ට්‍රොනික පදනමකට මාරුවිය හැකි පරිදි, කොළඹ කොටස් හුවමාරුව විසින් ඉදිරිපත් කරන ලද කොටස් තැරැව්කරුවන්ගේ නීති, මධ්‍යම තැන්පතු පද්ධති නීති හා ලැයිස්තුගත කිරීමේ නීතිවලට සංශෝධන අනුමත කරන ලදී.
  - කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි ජංගම මෘදුකාංගය, විද්‍යුත් කොන්ත්‍රාත් ගිවිසුම් හා විද්‍යුත් ප්‍රකාශන, විද්‍යුත් බැංකු හුවමාරු හරහා ලාභාංශ ගෙවීම යනාදිය සඳහා මධ්‍යම තැන්පතු පද්ධතිය හරහා මංගත ගිණුම් විවෘත කිරීම බලාත්මක කරන ලදී.
  - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වී ජාතික හැඳුනුම්පතේ සත්‍යතාවය තහවුරු කළ හැකි පරිදි හැඳුනුම්පත් කළමනාකරණ මෙවලමක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් විවෘත කිරීමේ ජංගම මෘදුකාංගයට ඇතුළත් කරන ලදී.

**2020 ඔක්තෝබර්**

- අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලත් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කරන ලදී.

**2020 දෙසැම්බර්**

- කොටස් තැරැව්කරුවන්/බෙදාහරින්නන් සඳහා අදාළ වන යහභාවිතයන් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලද අතර වෙළඳපළ ආවේක්ෂණය පිළිබඳ අත්පොත යාවත්කාලීන කරන ලදී.

**අපේක්ෂිත**

- පැවරීමට එරෙහිව ගෙවීම් යාන්ත්‍රණය (Delivery vs Payment - DvP) ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම හා ආන්තික පද්ධතිය (Margining System) වැඩිදියුණු කිරීම.
  - වෙළඳපොළෙහි පසු වෙළඳ අවදානම අවම කිරීම සඳහා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව හා අනෙකුත් වෙළඳපොළ කොටස්කරුවන්ගේ අදහස් ලබා ගනිමින්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පැවරීමට එරෙහිව ගෙවීම් යාන්ත්‍රණය හා දියුණු කරන ලද ආන්තික පද්ධතිය සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණු පසු, කොළඹ කොටස් වෙළඳපොළට එය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලුම පද්ධති වැඩිදියුණු කිරීම් ඇතුළත්ව යෝජනා කරන ලද පැවරීමට එරෙහිව ගෙවීම් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම 2021 දෙවන කාර්තුව වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.
- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ඩිජිටල්කරණය අවසන් කිරීමේ දෙවන අදියර පහත පියවරයන් සම්පූර්ණ කිරීමට තිබේ:

- විද්‍යුත් පසුම්බිය (e - Wallet) : විද්‍යුත් ආයෝජන/අරමුදල් නැංවීම ආදිය බලාත්මක කිරීමේ වේදිකාවකි.
- විද්‍යුත් මූලික මහජන නිකුතු (e - IPO)
- මූලික මහජන නිකුතු සඳහා විද්‍යුත් දායකත්වය
- විද්‍යුත් ද්වාරය (e - Portal) : ගනුදෙනුකරුවන් සඳහා ඍජුවම ඔහුගේ/ඇයගේ මධ්‍යම තැන්පතු පද්ධති ගිණුමට ප්‍රවේශ වීමට හා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පවතින වේදිකාවකි.
- විදේශ මුදල් තව තවත් රට තුළට ගලා ඒම වැඩිදියුණු කිරීම සඳහා වෙනත් රටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි වෙබ් ද්වාර ඉදි කිරීම.

**ගෙවීම් හා පියවීම්**

2020 ජනවාරි 20 - 2014 අංක 1 දරන පොදු විධිවිධානය ප්‍රතිස්ථාපනය කරමින් ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමවේදය යටතේ නිකුත් කරන ගෙවීම් කාඩ්පත් භාවිතා කරමින් සිදු කරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සඳහා අය කළ හැකි උපරිම ගාස්තු ඇතුළත් කිරීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු ඇතුළත් 2020 අංක 1 දරන පොදු විධිවිධානය නිකුත් කරන ලදී.

2020 මැයි 14 - සුළු පරිමාණ ගෙවීම් සඳහා LANKAQR ප්‍රචලිත කිරීමට, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්, නිකුත් කරන්නන් හා අත්පත්කරුවන් ලෙස LANKAQR හා සම්බන්ධ වීම අනිවාර්ය කරමින් 2020 අංක 13 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2020 ජූනි 01 - ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්හි නව ප්‍රවණතා ආවරණය කරමින් මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමට 2018 අංක 01 දරන මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරමින් ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ 2020 අංක 01 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.

2020 ජූනි 08 - ලංකාපේ (LankaPay) මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු කෙරෙන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවක උපරිම වටිනාකම තීරණය කිරීමේ ක්‍රියාපටිපාටිය ඇතුළත් කිරීමට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල වටිනාකම සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව සඳහා වූ 2020 අංක 16 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 17 - ලංකාසෙට්ල් (LankaSettle) පද්ධතියේ ගනුදෙනු ගාස්තු සංශෝධනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු භාරගන්නා කාලය දීර්ඝ කිරීමට 2020 අංක 18 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. ඒ අනුව, තත්කාලීන දළ පියවීම් පද්ධති ගනුදෙනු සඳහා ගනුදෙනුකරුගෙන් අය කරන ගාස්තුව රුපියල් 1,000 සිට රුපියල් 400ට අඩු කරන ලද අතර මෙහෙයුම් ගාස්තුව රුපියල් 450 සිට රුපියල් 200 දක්වා අඩු කරන ලදී.

2020 නොවැම්බර් 27 - ලංකාපේ (LankaPay) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහ ලංකාපේ (LankaPay) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ වගකීම් කළමනාකරණ සීමාවන් සහ වගකීම් කළමනාකරණ සීමාවන් පැනවීම සඳහා වන බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ගීකරණය සංශෝධනය කිරීමට 2020 අංක 19 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2020 දෙසැම්බර් 11 - අන්තර්ජාල බැංකුකරණය, ජංගම දුරකථන පදනම් කරගත් බැංකුකරණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීම් සඳහා ගනුදෙනුකරුවකුගෙන් අයකරනු ලබන ලංකාපේ (LankaPay) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, ගනුදෙනුවක් සඳහා වන උපරිම ගාස්තුව සංශෝධනය කිරීමට 2020 අංක 20 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී.

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

2020 පෙබරවාරි 05 - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම් සඳහා අවස්ථා පාදක කරගත් LankaFIN වාර්තාකරණය පිළිබඳ 2020 අංක 1 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.

2020 ජූනි 10 - ගණකාධිකාරීවරුන් සහ භාර හෝ සමාගම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අනුකූලතා බැඳීම් පිළිබඳ 2020 අංක 2 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී.

| | |
|---|---|
| 2020 ජූනි 15 | - මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධව මතු වන අවදානම් පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස උපදෙස් සපයන 2020 අංක 3 දරන චක්‍රලේඛය, මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2020 ඔක්තෝබර් 22 | - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් ප්‍රතිමුඛ (Non Face-to-Face) ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම පිළිබඳ 2020 අංක 3 දරන මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. (අවලංගු කෙරිණි.) |
| 2020 දෙසැම්බර් 30 | - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් ප්‍රතිමුඛ (Non Face-to-Face) ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම පිළිබඳ 2020 අංක 3 දරන සංශෝධිත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු**

2020 මාර්තු 19 - ඕනෑම අරමුණක් සඳහා විදේශගත වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට එ.ජ. ඩොලර් 5,000ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක) උපරිමයකට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු (පෙර අවසර ලබා දී තිබූ එ.ජ. ඩොලර් 10,000ක විදේශ විනිමය සංචාරක දීමනාව හා සැසඳීමේ දී) නිකුත් කිරීමට බලයලත් වෙළඳුන් හට දන්වමින් 2020 විධාන අංක 01 නිකුත් කරන ලදී.

2020 මාර්තු 20 - බැංකු පනතේ ආනයන හා විදේශ ව්‍යවහාර මුදල් ආයෝජන සීමා කිරීමට නිකුත් කරන ලද විධානයන්ට සමගාමීව ඇතැම් අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ, ගෙවීම මත ලේඛන (Documents Against Payments) සහ විවෘත ගිණුම් ක්‍රම (Open Account Payment Terms) යටතේ ආනයනය කිරීම සඳහා වන ගෙවීම්වලට විදේශ විනිමය නිකුත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි, 2020 ජූනි 20 දක්වා මාස තුනක කාලයකට අත්හිටුවිය යුතු බව බලයලත් වෙළෙඳුන් හට දන්වමින් 2020 විධාන අංක 02 නිකුත් කරන ලදී.

- විදේශ සංචිත අඩු වීමකින් තොරව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කෙටිකාලීන ඩොලර් ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරාලීමට විකල්ප මැදිහත්වීමේ යාන්ත්‍රණයක් වශයෙන් විකුණුම්-ගැනුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසි ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2020 අප්‍රේල් 02 - 2020 අප්‍රේල් 02 දින සිට මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත පහත ක්‍රියාමාර්ග පැනවීම සඳහා 2020 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 22 වන වගන්තිය යටතේ වූ නියමයක් ලෙස අංක 2169/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- පහත සඳහන් අවස්ථාවල දී හැර, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් විදේශ ආයෝජන සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා ලබා දී ඇති පොදු අවසරය අත්හිටුවීම.
  - (අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන හෝ,
  - (ආ) ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන ආයෝජන
- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ හැර අනෙකුත් ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම.
- දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් යැවීම අත්හිටුවීම.
- සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ. ඩොලර් 30,000ක උපරිමය දක්වා සීමා කිරීම.
- පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා එක් එක් ආයෝජනය මත පදනම්ව ඉහත (අ) සහ (ආ) නිර්ණායක සපුරාලන අවස්ථාවල දී පමණක් අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පැවරිණි.

2020 අප්‍රේල් 03 - අවශ්‍ය වූ විටෙක දී අවසාන පිළියම වශයෙන්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය, ගිණුම්හිමියා විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහයන් නොලබන විට දී, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර අයකර ගැනීම සිදු කළ යුතු බව බලයලත් වෙළඳුන් හට දන්වමින් 2020 විධාන අංක 03 නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 08 - ද්විත්ව පුරවැසියන් ඇතුළුව, ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන් සහ අරමුදල්, සංස්ථාපිත ආයතන, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති සංගම් හා ශ්‍රී ලංකාවේ සුභසිද්ධිය පතන වෙනත් පාර්ශ්ව ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වෙනත් ඕනෑම පුද්ගලයෙකු සඳහා විශේෂ තැන්පතු ගිණුමක් හඳුන්වා දීම සඳහා අංක 2170/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර එහි පහත සඳහන් විශේෂ ලක්ෂණ අන්තර්ගත වේ.

- අවම කාලසීමාව : මාස හයකි
- ගෙවිය යුතු පොලිය : අදාළ බැංකුවෙහි සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා අදාළ වන තැන්පතු පොලී අනුපාතවලට වඩා වාර්ෂික ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් පිළිවෙළින් මාස 6ක සහ මාස 12ක කාලසීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා කල්පිරීමේ දී ගෙවනු ලැබේ.
- අරමුදල් ආපසු යැවීම : කාලීන තැන්පතු කල්පිරීමේ දී විදේශ මුදල් බවට පරිවර්තනය කිරීම සහ ආපසු යැවීම නිදහසේ සිදු කළ හැකිය.

2020 අප්‍රේල් 09 - විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සහ අවසරලත් හර බැර පිළිබඳ නිර්ණායක සඳහන් කරමින් 2020 අංක 04 දරන විධාන බලයලත් වෙළඳුන් හට නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 16 - අවශ්‍ය වූ විට දී අවසාන පිළියම වශයෙන්, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ලබා දුන් ණය, ණයගැතියා විදේශ විනිමය මුදල් ප්‍රවාහයක් නොලබන විටක දී, ශ්‍රී ලංකා රුපියල්වලින් අය කර ගත යුතු බව බලයලත් වෙළඳුන් හට දන්වමින් 2020 විධාන අංක 05 නිකුත් කරන ලදී.

2020 ජූලි 01 - ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික යම් තැනැත්තෙකු හට තම සන්තකයේ රඳවා තබා ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය, පෙර අනුමත ප්‍රමාණය වන එ.ජ. ඩොලර් 10,000 සිට එ.ජ. ඩොලර් 15,000 දක්වා ඉහළ නැංවීම සඳහා විදේශ විනිමය පනතෙහි 8වන වගන්තිය යටතේ වූ නියමයක් ලෙස අංක 2182/33 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම දිරිගැන්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම් දෙමින් අංක 2182/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර එම ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- විශේෂ තැන්පතු ගිණුම් සඳහා අරමුදල් සපයන ප්‍රභවයන් පුළුල් කිරීම.

  (අ) 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති ඕනෑම පුද්ගලයෙකුට, 2020 ඔක්තෝබර් 07 වන දින ඉක්මවීමට පෙර, එවැනි පුද්ගලයන් විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගත් සහ පහත කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමයවලින්, ශ්‍රී ලංකාවේ ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමඟ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ හැකිය.

    - එවැනි විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් 15,000ක් හෝ ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් හෝ අඩුවන අවස්ථාවක දී, නියමිත බලයලත් වෙළෙන්දා වෙත සුදුසු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත
    - එවැනි විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් 15,000ක් හෝ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් හෝ ඉක්මවන අවස්ථාවක දී, පැමිණෙන තොටුපොළෙහි දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් කිරීම මත

  (ආ) ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික ඕනෑම පුද්ගලයෙකුට එ.ජ. ඩොලර් 15,000ක උපරිමයකට යටත්ව තම සන්තකයේ පවත්නා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මගින්, පවත්නා නියෝග සහ නියමයන්ට යටත්ව එම මුදල් ඉපයීමේ මූලාශ්‍ර සම්බන්ධයෙන් බලයලත් වෙළෙන්දකු හට ප්‍රකාශයක් ලබා දීමට යටත්ව, 2020 ඔක්තෝබර් 07 දින හෝ ඊට පෙර ඕනෑම බලයලත් වෙළෙන්දකු සමඟ විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කළ හැකිය.

- විශේෂ තැන්පතු ගිණුම් මත ණය පහසුකම් ලබා ගැනීම

  (අ) විශේෂ තැන්පතු ගිණුම් හිමියන්ට පහත දැක්වෙන පරිදි, විශේෂ තැන්පතු ගිණුම ඇපයට තබා ණය පහසුකම් ලබා ගත හැක.

| | |
|---|---|
| | - නේවාසිකයන් ශ්‍රී ලංකාවේ රුපියල්වලින්<br>- පවත්නා නියෝග යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ නේවාසික නොවන විශේෂ තැන්පතු ගිණුම් හිමියන් |
| 2020 ජූලි 02 | - මාස 6ක කාලයක් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත නව ක්‍රියාමාර්ග පැනවීම සඳහා විදේශ විනිමය පනතෙහි 22 වන නියමය යටතේ අංක 2182/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.<br>• පහත සඳහන් අවස්ථාවන් හැර, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජනය කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා ලබා දී ඇති පොදු අවසරය අත්හිටුවීම.<br>(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබා ගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන,<br>(ආ) ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්,<br>(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා, දැනටමත් විදේශ රටක පිහිටුවා ඇති උප සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයන්/අරමුදල් යෙදවීමක්,<br>(ඈ) දැනටමත් විදේශ රටක පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඒ හා සමාන ඕනෑම කාර්යාලයක් නඩත්තු කිරීමේ අරමුණ ඇතිව එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.<br>• ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ඕනෑම ප්‍රමාණයක ජංගම ගනුදෙනු හෝ එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා වන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ හැර අනෙකුත් ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම.<br>• සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා වන සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ. ඩොලර් 30,000ක උපරිමයක් දක්වා සීමා කිරීම.<br>• දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම, එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා සීමා කිරීම.<br>• පොදු අවසරයෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන එක් එක් ආයෝජන මත පදනම්ව ඉහත (අ) සහ (ආ) නිර්ණායක සපුරාලන අවස්ථාවල දී පමණක් අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පැවරිණි. |
| 2020 ජූලි 06 | - විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම, අවසරලත් හර බැර සහ වෙනත් අවශ්‍යතාවයන් පිළිබඳ වැඩිදුර නිර්ණායක සඳහන් කරමින් 2020 අංක 6 දරන විධාන නිකුත් කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 23 | - රට තුළට නව විදේශ විනිමය ගලා ඒම් දිරිමත් කිරීමේ අරමුණින් අනේවාසිකයන්ගේ අභ්‍යන්තර ආයෝජන ගිණුම් හරහා සිදු කෙරෙන විදේශ මුදල් ගලා ඒම් හා සම්බන්ධ විදේශ විනිමය අවදානම වළක්වා ගැනීම සඳහා "අභ්‍යන්තර ආයෝජන හුවමාරුව" නැමැති යෝජනා ක්‍රමය යටතේ වසරකට වඩා වැඩි සහ වසර දෙකක් දක්වා යන කාලය සඳහා නව එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ගැනුම් - විකුණුම් මුදල් හුවමාරු ගිවිසුම් යෝජනා ක්‍රමයක් වෙළඳපළට හඳුන්වාදෙන ලදී. |
| 2020 ඔක්තෝබර් 06 | - අංක 2196/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, තැන්පතු කල් පිරීමේ දිනය ඉක්මවීමෙන් පසුව විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම් අලුත් කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබා දුන් අතර එම ගිණුම් සඳහා ලබා දිය හැකි වනුයේ, බලයලත් වෙළඳුන් විසින් සාමාන්‍ය කාලීන තැන්පතු සඳහා ලබා දෙන පොලී අනුපාත පමණි. එවැනි විශේෂ තැන්පතු ගිණුම්වල ඇති අරමුදල් කාලීන තැන්පතුවල කල්පිරීම මත විදේශ මුදල් බවට පත් කිරීම සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම නිදහසේ සිදු කළ හැක. |

| | |
|---|---|
| 2020 ඔක්තෝබර් 07 | - විදේශ විනිමය පනතෙහි විධිවිධානවලට අනුව, විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කර පවත්වාගෙන යනු ලබන ගිණුම් හිමියෙකු පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට ද සුදුසුකම් ලැබූවෙකු වන විට දී එකී විශේෂ තැන්පතු ගිණුම් තුළින් එම ගිණුම් හිමියා ලද පොලිය ඇතුළු කල්පිරීමෙන් ලද මුදල්, පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම්වලට බැර කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙමින් 2020 විධාන අංක 07 නිකුත් කරන ලදී. |
| | - විදේශ විනිමය පනතෙහි විධිවිධානවලට අනුව, විශේෂ තැන්පතු ගිණුමක් විවෘත කර පවත්වාගෙන යනු ලබන ගිණුම් හිමියෙකු ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට ද සුදුසුකම් ලැබූවෙකු වන විට දී එකී විශේෂ තැන්පතු ගිණුම් තුළින් එම ගිණුම් හිමියා ලද පොලිය ඇතුළු කල්පිරීමෙන් ලද මුදල්, ආමුඛ ආයෝජන ගිණුම්වලට බැර කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙමින් 2020 විධාන අංක 08 නිකුත් කරන ලදී. |
| | - විදේශ විනිමය පනතෙහි විධිවිධානවලට අනුව, ආමුඛ ආයෝජන ගිණුමක් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොලිය ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල් පිරීමේ දී ලද මුදල්, එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමට හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමකට මාරු කිරීම සඳහා හර කිරීමට අවසර ලබා දෙමින් බලයලත් වෙළෙඳුන් වෙත 2020 විධාන අංක 09 නිකුත් කරන ලදී. |
| 2020 නොවැම්බර් 17 | - අංක 2170/4 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි සහ අංක 2182/32 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි වලංගු කාලය මාස 6 සිට මාස 12 දක්වා සංශෝධනය කරමින් අංක 2202/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. |
| 2020 නොවැම්බර් 25 | - විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සඳහා ලබා දුන් කාල සීමාව මාස 6 සිට මාස 12 දක්වා දීර්ඝ කිරීමට සහ අවසරලත් බැර කිරීම් යටතේ ආමුඛ ප්‍රේෂණ ලෙස ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට ලැබුණු මුදල්වලින් වන මාරු කිරීම් සඳහා ලබා දුන් කාල සීමාව මාස 6 සිට මාස 12 දක්වා දීර්ඝ කිරීමට නියම කරමින් 2020 අංක 10 දරන විධාන බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලදී. |
| 2020 දෙසැම්බර් 15 | - විදේශ ව්‍යවහාර මුදල් මිල දී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සිදු කරන, තම මූලික ව්‍යාපාර ලෙස විදේශ මුදල් හුවමාරු ව්‍යාපාරයෙහි නිරතව සිටින පරිසීමිත වෙළෙඳුන්ට (මුදල් හුවමාරු කරන්නන්ට) අදාළ කොන්දේසි හා නියමයන් පිළිබඳව දැනුවත් කිරීම සහ ඔවුන් වෙත නිකුත් කරන ලද විධානයන්ට සහ විදේශ මුදල් හුවමාරු බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූල නොවීම සඳහා පියවර ගැනීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට හැකියාව ලැබෙන පරිදි 2020 විධාන අංක 11 නිකුත් කරන ලදී. |
| 2020 දෙසැම්බර් 18 | - විදේශ විනිමය පනතෙහි 22 වන වගන්තිය යටතේ නිකුත් කළ, අංක 2182/37 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද නියමයෙහි වලංගු කාලය, 2021 ජනවාරි මස 02 දින සිට තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරමින් 2206/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. |
| 2021 ජනවාරි 15 | - කොන්දේසිවලට යටත්ව විදේශ ණය නැවත ගෙවීමේ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වන විදේශ විනිමය අවදානම සමනය කරවීමට තාවකාලික විශේෂ විදේශ විනිමය ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට අවසර ලබා දෙමින් බලයලත් වෙළඳුන් වෙත 2020 විධාන අංක 01 නිකුත් කරන ලදී. |
| 2021 ජනවාරි 27 | - විදේශ සංචිත ගොඩනැංවීම සඳහා බලපත්‍රලාභී බැංකුවල පරිවර්තනය කරන ලද සේවා නියුක්තිකයන්ගේ අභ්‍යන්තර ප්‍රේෂණවලින් සියයට 10ක් අනිවාර්ය පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සඳහා වන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට අදාළව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. කෙසේ වුවද, පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මෙම අවශ්‍යතාව 2021 මාර්තු 17 දින සිට තාවකාලිකව අත්හිටුවන ලදී. |
| 2021 පෙබරවාරි 03 | - දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් බලයලත් වෙළෙඳුන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා පැවති නියෝග හා නියමයන් අවලංගු කරමින් 2021.03.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නියෝග හා නියමයන් නිකුත් කරන ලදී.<br>• ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 01 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී. |

- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 02 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/35 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 03 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/36 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 04 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 05 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/38 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, අපනයනය කිරීම හෝ ආනයනය කිරීම මත විදේශ විනිමය පනතෙහි 8 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් නිශ්චය කිරීම සඳහා විදේශ විනිමය පනතෙහි 31 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/40 දරන අති විශේෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 18

- අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීති සංශෝධනය කෙරිණි. ඒ අනුව, සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් සියයට 25ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය (අංක 2215/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය).
- මුදල් නීති පනත යටතේ 2021 පෙබරවාරි 18 දින නිකුත් කළ ගැසට් නිවේදනය සහ රීති යටතේ, විදේශ සංචිත ගොඩනැංවීමේ අරමුණින් අපනයන ආදායම් ලැබීම්වලින් සියයට 25ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කළ අතර එයින් සියයට 50ක් බලපත්‍රලාභී බැංකු විසින්, අනිවාර්ය පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණිය යුතු බව දක්වමින් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. කෙසේ වුවද, පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් 2021 මාර්තු 17 දින මෙම අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවන ලදී.

2021 මාර්තු 18

- 2021 පෙබරවාරි 03 දින නිකුත් කරන ලද නියෝගවලට හා නියමයන්ට සමගාමීව බලයලත් වෙළඳුන් වෙත පහත සඳහන් විධාන (2021 මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි) නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් වෙනුවෙන් බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරන ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය පනතේ 6 වන වගන්තිය යටතේ 2021 අංක 2 දරන විධාන නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ට සිදු කරනු ලබන විදේශ විනිමය ගෙවීම් සඳහා විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් 2021 අංක 3 දරන විධාන නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාවේ සුදුසුකම් ලත් නේවාසික/අනේවාසික පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 4 දරන විධාන නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාව තුළ නේවාසික විදේශ විනිමය උපයන්නන් විසින් සිදු කරන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 5 දරන විධාන නිකුත් කරන ලදී.
  - රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල/පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs) හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට (DRAs) අදාළව 2021 අංක 6 දරන විධාන නිකුත් කරන ලදී.

- "ශ්‍රී ලංකාව - මගේ සිහින නිවහන වැඩසටහන" යටතේ නේවාසික වීසා බලපත්‍ර මත දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ වාසය කිරීමට කැමති සහ වයස අවුරුදු 55ට වැඩි ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ විශේෂ ගිණුම්වලට අදාළව 2021 අංක 7 දරන විධාන නිකුත් කරන ලදී.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද "නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය" යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන ආයෝජකයන් හා වෘත්තිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමයේ විශේෂ ගිණුම්වලට අදාළව 2021 අංක 08 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි විදේශ විනිමය උපයන්නන් හට ණය පහසුකම් ලබා දීම සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට සපයන ණය පහසුකම් සම්බන්ධයෙන් වන 2021 අංක 09 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන් හට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය හා අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැර) හට ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වන 2021 අංක 10 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් ස්ථිර නේවාසිකයන්ට සහ ද්විත්ව පුරවැසියන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා ස්ථිර නේවාසික වීසා බලපත්‍රය මත ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් හෝ ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයන් හට ප්‍රදානය කරන ණය සම්බන්ධයෙන් 2021 අංක 11 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සහ අලෙවිය සඳහා අනුමත නියෝජිතයන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී විසින් පත් කරන ලද බලයලත් වෙළෙඳුන් හා ප්‍රාථමික වෙළෙඳුන් හට අවසර දීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සම්බන්ධයෙන් වන 2021 අංක 12 දරන විධාන නිකුත් කරන ලදී.
- ආකෘති පත්‍ර 1 සහ 2 හි ගනුදෙනු බලයලත් වෙළෙඳුන් විසින් වාර්තා කිරීමේ අවශ්‍යතාවය දක්වමින් විදේශ විනිමය විකිණීම (ආකෘති පත්‍රය 1) සහ විදේශ විනිමය මිලදී ගැනීම (ආකෘති පත්‍රය 2) සම්බන්ධයෙන් වන 2021 අංක 13 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ප්‍රේෂණ සිදු කිරීමට ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 14 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ ආමුඛ ප්‍රේෂණ සිදු කිරීමට අනේවාසික අයෝජකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 15 දරන විධාන නිකුත් කරන ලදී.
- සංක්‍රමණික දීමනාව ලබා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 16 දරන විධාන නිකුත් කරන ලදී.
- නියාමන අවශ්‍යතාවයන්ට යටත්ව ශ්‍රී ලංකාවෙන් උපයාගත් ජංගම ආදායම් ලබා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම සම්බන්ධයෙන් වන 2021 අංක 17 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික විගාමිකයන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත ආයතන/සමාගම් විසින් ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා අනේවාසික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 18 දරන විධාන නිකුත් කරන ලදී.
- විදේශීය ණය දෙන්නන්ගෙන් ලබා ගත් ණය මුදල් බැර කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම් විසින් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා විදේශ වාණිජ ණය ගැනීමේ ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 19 දරන විධාන නිකුත් කරන ලදී.
- ජංගම හා ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ඇපකර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා අදාළ වන විධාන දක්වමින් 2021 අංක 20 දරන විධාන නිකුත් කරන ලදී.

**ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි**

2020 මාර්තු 24 - තෝරාගත් භාණ්ඩ ආනයනය කිරීමට පහසුකම් සැලසීම අත්හිටුවමින් ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අංක 01/2020 දරන මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 16 - ආනයනය තාවකාලිකව තහනම් කරන ලද භාණ්ඩ ලැයිස්තුවක් සහ අවමය දින 30ක් වූ ණය පහසුකමක් යටතේ ආනයනය කළ හැකි තවත් භාණ්ඩ ලැයිස්තුවක් දක්වමින් 2020 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2171/5 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2020 මැයි 22 - මාස තුනක කාලයක් සඳහා වලංගු වන පරිදි අංක 2171/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය යාවත්කාලීන කරමින් 2020 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2176/19 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද භාණ්ඩ සහ විදේශ සැපයුම්කරුවෙකු විසින් සපයනු ලබන අනිවාර්ය ණය කාලපරිච්ඡේදයක් යටතේ පමණක් ආනයනය කරන භාණ්ඩ ලැයිස්තු යාවත්කාලීන කරන ලදී. එයට ඇතුළත් නිදහස් කිරීම් හිමි ලැයිස්තුවක් සහ අනෙකුත් නියාමන සහ පරිපාලන ක්‍රියාමාර්ග ද හඳුන්වා දෙන ලදී.

2020 ජූනි 30 - අංක 2176/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය යාවත්කාලීන කරමින් 2020 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2182/10 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2020 ජූලි 16 - නැවත දැනුම් දෙන තුරු ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා ආනයන සහ අපනයන පාලන රෙගුලාසි අංක 02 සහ 03 යාවත්කාලීන කරමින් 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2184/21 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. ආනයනය තාවකාලිකව අත්හිටුවන ලද සහ විදේශ සැපයුම්කරුවෙකු විසින් සපයනු ලබන අනිවාර්ය ණය පහසුකමක් යටතේ ආනයනය කරන භාණ්ඩ ලැයිස්තු යාවත්කාලීන කර නිකුත් කරන ලදී. එයට ඇතුළත් නිදහස් කිරීම් හිමි ලැයිස්තුවක් සහ අනෙකුත් නියාමන සහ පරිපාලන ක්‍රියාමාර්ග ද නිකුත් කරන ලදී.

2020 අගෝස්තු 17 - නිශ්චිතව නොදක්වන ලද වලංගු කාල සීමාවක් සමඟ, ආනයන බලපත්‍ර අවශ්‍ය වන බවට ගැසට් නිවේදනයේ නිශ්චය කොට ඇති භාණ්ඩ ලැයිස්තුව තාවකාලිකව අත්හිටුවමින්, 2020 අංක 05 දරන ආනයන සහ අපනයන රෙගුලාසි (අංක 2189/4 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 15 - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2020 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2193/9 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2020 ඔක්තෝබර් 19 - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2020 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2198/2 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2020 දෙසැම්බර් 24 - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2020 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2207/15 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 ජනවාරි 05 - 202 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ටයර් ආනයනවලට සම්බන්ධ භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2209/18 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 11 - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින පිගන් මැටි නිෂ්පාදන සහ සාරි ආශ්‍රිත භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2214/56 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

**මිල සංශෝධන**

අයිතම කිහිපයක උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.01.29 | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | ඉවත දැමිය හැකි ශල්‍ය මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ (එන් 95 වර්ගය - අංශු ශ්වසන පෙරණය) | ඒකකයකට රුපියල් 150ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.02.23 | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 78ක සිට රුපියල් 190ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.03.12 | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) සම සහිත | කිලෝග්‍රෑමයට රුපියල් 430ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) සම රහිත | කිලෝග්‍රෑමයට රුපියල් 500ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බඩ ඉරිඟු (ඕනෑම කාර්යයක් සඳහා භාවිතා කරන) | කිලෝග්‍රෑමයට රුපියල් 55ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.03.16 | පහත සඳහන් වෛද්‍ය උපකරණ සඳහා 2020 ජනවාරි 29 වන දින පනවන ලද උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී. | |
| | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - ස්ථර තුනක් සහිත - නොවියන ලද (ලූපය හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 50ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ - එන් 95 වර්ගය (ශල්‍ය/සෞඛ්‍ය රක්ෂිත/ශ්වසන/වෛද්‍ය) | ඒකකයකට රුපියල් 325ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.03.18 | මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 130ක සිට රුපියල් 65ක් දක්වා පහළ දමන ලදී. |
| | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 190ක සිට රුපියල් 150ක් දක්වා පහළ දමන ලදී. |
| | ටින් මාළු | ශුද්ධ බර ග්‍රෑම් 425ක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 140ක සිට රුපියල් 100ක් දක්වා පහළ දමන ලදී. |
| 2020.03.20 | 2020 ජනවාරි 29 වන දින පනවන ලද, 2020 මාර්තු 16 වන දින සංශෝධිත, වෛද්‍ය උපකරණ සඳහා වන උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. | |
| 2020.04.10 | කීරි සම්බා | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98ක සිට රුපියල් 90ක් දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 90ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් හා අට්ටික්කාරී හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98ක සිට රුපියල් 90ක් දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 85ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.04.21 | කහ කුඩු | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 750ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.04.28 | සුදු සීනි (ඇසුරුම් නොකළ) | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 100ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| | සුදු සීනි (ඇසුරුම් කළ) | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 105ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.04.30 | මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 65ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| | ටින් මාළු | ශුද්ධ බර ග්‍රෑම් 425ක් සඳහා වූ රුපියල් 100ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.05.28 | කීරි සම්බා | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 125 සිට රුපියල් 120 දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 98ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 98ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෛයිකරුපන් හා අට්ටික්කාරි හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 96ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 85ක සිට රුපියල් 93ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.07.29 | ඩෙංගු සඳහා වන NS1 ප්‍රතිදේහජනක පරීක්ෂණය | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 1,200ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | පූර්ණ රුධිර ගණන පරීක්ෂණය | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 400ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.09.23 | කහ කුඩු | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 750ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.09.25 | වට ප්‍රමාණය අඟල් 13ට වැඩි පොල් | පොල් ගෙඩියකට රුපියල් 70ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | වට ප්‍රමාණය අඟල් 12-13 අතර පොල් | පොල් ගෙඩියකට රුපියල් 65ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | වට ප්‍රමාණය අඟල් 12ට අඩු පොල් | පොල් ගෙඩියකට රුපියල් 60ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.11.04 | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 94ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 94ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෛයිකරුපන් හා අට්ටික්කාරි හැර) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 92ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 89ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.11.10 | සුදු සීනි (ඇසුරුම් කළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 90ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු සීනි (ඇසුරුම් නොකළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 85ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු සීනි | ආනයනකරු විසින් විකිණිය යුතු උපරිම තොග මිල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 80කි. |
| 2021.02.08 | සුදු සීනි, වියළි මිරිස් (කුඩු නොකළ හෝ නොඇඹරූ), අර්තාපල් (ආනයනික), කීරි සම්බා | උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |

**බදු සංශෝධන**

**ආදායම් බදු**

**පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු**

2020 ජනවාරි 01 - පුද්ගල ආදායම් බදු අනුපාතික, බදු කාණ්ඩ සහ බදු නිදහස් සීමාව පහත පරිදි සංශෝධනය කරන ලදී.

| පැවති තත්ත්වය | | වර්තමාන තත්ත්වය | |
|---|---|---|---|
| බදු නිදහස් සීමාව | | | |
| සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 1.2ක් සහ පුද්ගල ආදායම සඳහා වාර්ෂිකව රුපියල් 500,000ක් | | ඕනෑම ආදායමක් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 3ක් | |
| බදු අය කළ හැකි ආදායම | | | |
| බදු කාණ්ඩය | බදු අනුපාතිකය | බදු කාණ්ඩය | බදු අනුපාතිකය |
| පළමු රු. 600,000 | 4% | පළමු රු. 3,000,000 | 6% |
| රු. 600,001 - රු. 1,200,000 | 8% | රු. 3,000,001 - රු. 6,000,000 | 12% |
| රු. 1,200,001 - රු. 1,800,000 | 12% | රු. 6,000,000 ඉක්මවන | 18% |
| රු. 1,800,001 - රු. 2,400,000 | 16% | | |
| රු. 2,400,001 - රු. 3,000,000 | 20% | | |
| රු. 3,000,000 ඉක්මවන | 24% | | |

- සංස්ථාපිත ආදායම් බදු අනුපාතික පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28ක සිට සියයට 24ක් දක්වා අඩු කරන ලදී.
  - ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28ක සිට සියයට 14ක් දක්වා අඩු කරන ලදී.
  - නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 18ක් ලෙස සංශෝධනය කරන ලදී.
  - ඔට්ටු හා සූදු, මත්පැන් හා දුම්කොළ සඳහා වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 40ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

**උපයන විට ගෙවීමේ බද්ද**

2020 ජනවාරි 01 - ඕනෑම නේවාසික හෝ අනේවාසික පුද්ගලයකුගේ සේවා නියුක්ති ආදායම් මත අය කරන ලද උපයන විට ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී.

**අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද**

2020 අප්‍රේල් 01 - විකල්ප පදනම මත, උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හඳුන්වා දෙන ලදී. වාර්ෂික ආදායම රුපියල් මිලියන 3.0 ඉක්මවන සේවා නියුක්තිකයන්, රුපියල් මිලියන 3.0කින් යුත් එක් එක් බදු කාණ්ඩය සඳහා සියයට 6ක සහ සියයට 12 යන අනුපාතයන් යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගෙවීමට බැඳී සිටින අතර, ආදායම රුපියල් මිලියන 9ක් ඉක්ම වූ විට අදාළ වන බදු අනුපාතිකය සියයට 18කි. නේවාසික සේවා නියුක්තිකයන්ගේ[2] කැමැත්ත ඇතිව ඔවුන්ගේ වේතනයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලබන අතර, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගෙවීමට එකඟ නොවන ඕනෑම නේවාසික සේවා නියුක්තිකයෙකු අදාළ බදු කාණ්ඩ සහ අනුපාත මත පදනම්ව පුද්ගල ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. අනේවාසික සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් ගත් විට, එවැනි සේවා නියුක්තිකයන්ගේ කැමැත්ත නොතකා අදාළ සේවායෝජකයා විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද වේතනයෙන් අඩු කරනු ලැබේ (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/APIT/2020-01).

**රඳවා ගැනීමේ බදු**

2020 ජනවාරි 01 - පහත සඳහන් අවස්ථා හැර ඕනෑම නේවාසික පුද්ගලයකුට කරන ලද ඕනෑම ගෙවීමක් මත අය කරනු ලැබූ රඳවා ගැනීමේ බදු ඉවත් කරන ලදී.

- ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම හෝ සූදු ජයග්‍රහණ සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණ මත වූ සියයට 14ක රඳවා ගැනීමේ බද්ද
- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසියක දී ඕනෑම මැණික් වර්ගයක් විකිණීම මත වූ සියයට 2.5ක රඳවා ගැනීමේ බද්ද
- 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 සහ 85 වගන්ති යටතේ, ඕනෑම අනේවාසිකයකුට සිදු කරන ගෙවීම් මත වූ රඳවා ගැනීමේ බද්ද

2020 මාර්තු 31 - 2020 පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළ, 2020 මාර්තු 15 සහ 2020 අප්‍රේල් 15 වන දිනවලට ගෙවීමට නියමිතව තිබූ රඳවා ගැනීමේ බදු ගෙවීම් සඳහා නියමිත කාලය 2020 අප්‍රේල් 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/WHT/2020-04).

**ආර්ථික සේවා ගාස්තුව**

2020 ජනවාරි 01 - 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තුව ඉවත් කරන ලදී (2020 අංක 04 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත).

**ආදායම් බදු නිදහස් කිරීම්**

2020 ජනවාරි 01 - තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා මත උපයන ලාභ සහ ආදායම

- යම් සේවාවන් සඳහා වන ගෙවීම් බැංකුවක් හරහා විදේශ මුදල්වලින් ලැබෙන්නේ නම්, විදේශ ප්‍රභවයන්ගෙන් උපයන ආදායම ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන් සඳහා ලැබෙන ලාභය සහ ආදායම
- අනේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම් හෝ නේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම්වලින් උපයන පොලී ආදායම
- නේවාසික සමාගමක් විසින් ඕනෑම අනේවාසිකයකුට ගෙවන ලාභාංශ
- වාණිජ කේන්ද්‍රීය මෙහෙයුම්කරුවන් විසින් බෙදා හරිනු ලබන ලාභාංශ
- රසායනාගාර සේවා හෝ ප්‍රමිති සහතික කිරීමේ සේවාවන්ගෙන් ඕනෑම අනේවාසිකයකු විසින් ලබා ගත් මුදල්
- ප්‍රදාන සහ පරිත්‍යාග ලෙස ඕනෑම ආගමික ආයතනයකට ලැබෙන මුදල්

2 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව

**එකතු කළ අගය මත බදු**

2020 ජනවාරි 01 - එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රුපියල් මිලියන 12ක සිට වාර්ෂිකව රුපියල් මිලියන 300ක් දක්වා ඉහළ නංවන ලදී.

- තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2020 මාර්තු 23 - 2020 පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළ, 2020 මාර්තු 20 සහ 2020 අප්‍රේල් 20 දිනවලට ගෙවීමට නියමිතව තිබූ එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා නියමිත කාලය 2020 අප්‍රේල් 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/VAT/2020-03).

**නිෂ්පාදන/සුරා බදු**

2020 අප්‍රේල් 30 - ඊතයිල් මද්‍යසාර සඳහා වන සුරා බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2173/11 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

<table>
<tr><th rowspan="2">අයිතමය</th><th rowspan="2">මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය</th><th colspan="2">පෙර පැවති බද්ද 2016.03.02 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්)</th><th colspan="2">බදු සංශෝධනය 2020.04.30 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්)</th></tr>
<tr><th>දේශීයව සපයනු ලබන</th><th>ආනයනික</th><th>දේශීයව සපයනු ලබන</th><th>ආනයනික</th></tr>
<tr><td rowspan="4">රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර</td><td>ලීටර් 10,000 දක්වා</td><td rowspan="2">නිදහස්</td><td rowspan="2">නිදහස්</td><td rowspan="4">නිදහස්</td><td rowspan="2">නිදහස්</td></tr>
<tr><td>සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා ලීටර් 20,000 දක්වා</td></tr>
<tr><td>ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා</td><td>600</td><td>700</td><td>700</td></tr>
<tr><td>ලීටර් 20,000 ට වැඩි</td><td>1,000</td><td>1,100</td><td>1,100</td></tr>
<tr><td rowspan="4">අවසන් නිපැයුම් සුරා බදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර</td><td>ලීටර් 500 දක්වා</td><td>නිදහස්</td><td>200</td><td>නිදහස්</td><td>200</td></tr>
<tr><td>ලීටර් 501 සිට ලීටර් 10,000 දක්වා</td><td>600</td><td>700</td><td>100</td><td>700</td></tr>
<tr><td>ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා</td><td>700</td><td>800</td><td>150</td><td>800</td></tr>
<tr><td>ලීටර් 20,000 ට වැඩි</td><td>1,100</td><td>1,200</td><td>200</td><td>1,200</td></tr>
<tr><td rowspan="4">අවසන් නිපැයුම් සුරා බදු ගෙවීමට යටත් නොවන, අපනයන නිපැයුම් නිෂ්පාදනය සඳහා හෝ එවැනි අපනයන නිෂ්පාදන සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සේදීම සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර</td><td>ලීටර් 500 දක්වා</td><td>නිදහස්</td><td>නිදහස්</td><td>නිදහස්</td><td>නිදහස්</td></tr>
<tr><td>ලීටර් 501 සිට 10,000 දක්වා</td><td>600</td><td>700</td><td>100</td><td>700</td></tr>
<tr><td>ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා</td><td>700</td><td>800</td><td>150</td><td>800</td></tr>
<tr><td>ලීටර් 20,000 ට වැඩි</td><td>1,100</td><td>1,200</td><td>200</td><td>1,000</td></tr>
<tr><td>අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු සඳහා)</td><td>සෑම ලීටරයකටම</td><td>400</td><td>1,100</td><td>75</td><td>1,100</td></tr>
<tr><td>මද්‍යසාර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඊතයිල් මද්‍යසාර සඳහා වන බද්ද</td><td>සෑම ලීටරයකටම</td><td>10</td><td>10</td><td>10</td><td>10</td></tr>
</table>

2020 ජූනි 09 - ඊතයිල් මද්‍යසාර සඳහා වන සුරා බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2179/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

| අයිතමය | මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | බදු සංශෝධනය (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|
| | | දේශීයව සපයනු ලබන | ආනයනික |
| නිෂ්පාදනයන් සඳහා භාවිත වන ඊතයිල් මද්‍යසාර: | | | |
| 2020.03.30 සිට 2020.08.15 දක්වා කාලය සඳහා දේශීය අලෙවිය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදනයන්ට යොදා ගැනීම | ලීටර් 500 දක්වා | නිදහස් | 200 |
| | ලීටර් 501 සිට ලීටර් 10,000 දක්වා | | 700 |
| | ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා | | 800 |
| | ලීටර් 20,000 ට වැඩි | | 1,200 |
| අපනයනය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදන | සෑම ලීටරයටම | නිදහස් | 25 |

2021 ජනවාරි 08 - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් සඳහා වන සුරා බද්ද රුපියල් 50 සිට රුපියල් 25 දක්වා අඩු කරන ලදී (අංක 2209/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 11 - 2021 වසර සඳහා මද්‍යසාර භාවිතයට අය කරනු ලබන ගාස්තුවෙන් ඇතැම් හෝටල් නිදහස් කරන ලදී (අංක 2210/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

**නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද**

2020 ජූනි 02 - පාම් තෙල් මේද අම්ල සහ ටැලෝ මේද අම්ල සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 20 සිට සියයට 24ක් දක්වා වැඩි කරන ලදී (අංක 2178/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

තෝරාගත් පැණිරසකාරක පාන වර්ග සඳහා වන නිෂ්පාදන බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2189/47 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ 2197/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය) :

| අයිතමය | පැවති බද්ද 2019.03.06 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය 2020.08.22 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය 2020.10.13 සිට බලපැවැත්වෙන පරිදි |
|---|---|---|---|
| සීනි හෝ වෙනත් පැණි රසකාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 4ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය |
| 'ශක්ති ජනක පාන' ලෙස අලෙවි වන පාන වර්ග | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 4ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය |
| පලතුරු හෝ එළවළු යුෂ පාදක කර ගත් පානයන් - මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 9ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් |
| අනෙකුත් - මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 9ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් යන දෙකෙන් වැඩි අගය | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30ක් |

**ආනයන තීරු බදු**

පෙට්‍රල් හා ඩීසල් ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගය | දිනය | ආනයන තීරු බද්ද (ලීටරයට රුපියල්) | ආනයන තීරු බදු සහනය (ලීටරයට රුපියල්) | අදාළ තීරු බද්ද (ලීටරයට රුපියල්) | අධිභාරය (ආනයන තීරු බද්දේ ප්‍රතිශතයක් ලෙස) (ලීටරයට රුපියල්) |
|---|---|---|---|---|---|
| පෙට්‍රල් (92 ඔක්ටේන්) | 2020.03.14 | 35.00 | 5.00 | 30.00 | |
| | 2020.04.23 | 50.00 | | 50.00 | 26.00 (අ) |
| | 2020.06.30 | 50.00 | 6.00 | 44.00 | |
| | 2020.09.17 | 50.00 | 11.00 | 39.00 | |
| | 2020.11.11 | 50.00 | 7.00 | 43.00 | |
| | 2020.12.31 | 50.00 | 18.00 | 32.00 | |
| | 2021.02.02 | 50.00 | 29.00 | 21.00 | |
| | 2021.03.25 | 50.00 | 45.00 | 5.00 | |
| පෙට්‍රල් (95 ඔක්ටේන්) | 2020.03.14 | 35.00 | | 35.00 | 15.00 (අ) |
| | 2020.04.23 | 50.00 | | 50.00 | 49.00 (අ) |
| | 2020.06.24 | | | | 20.00 (අ) |
| | 2020.06.30 | 50.00 | 6.00 | 44.00 | |
| | 2020.08.24 | | | | 20.00 (ආ) |
| | 2020.11.24 | | | | 20.00 (ආ) |
| | 2020.12.31 | 50.00 | 16.00 | 34.00 | |
| | 2021.02.02 | 50.00 | 8.00 | 42.00 | 0.00 (ඇ) |
| | 2021.03.25 | 50.00 | 24.00 | 26.00 | |
| සුදු ඩීසල් | 2020.03.14 | 5.85 | | 5.85 | 11.00 (අ) |
| | 2020.04.23 | 25.00 | | 25.00 | 24.00 (අ) |
| | 2020.06.24 | | | | 12.00 (අ) |
| | 2020.06.30 | 25.00 | 7.00 | 18.00 | |
| | 2020.08.24 | | | | 12.00 (ආ) |
| | 2020.09.17 | 25.00 | 8.00 | 17.00 | |
| | 2020.11.11 | 25.00 | 3.00 | 22.00 | |
| | 2020.11.24 | | | | 12.00 (ආ) |
| | 2020.12.31 | 25.00 | 20.00 | 5.00 | |
| | 2021.02.02 | 25.00 | 14.00 | 11.00 | 0.00 (ඇ) |
| | 2021.03.25 | 25.00 | 25.00 | | |
| සුපිරි ඩීසල් | 2020.03.14 | 15.00 | | 15.00 | 20.00 (අ) |
| | 2020.04.23 | 25.00 | | 25.00 | 40.00 (අ) |
| | 2020.06.24 | | | | 30.00 (අ) |
| | 2020.06.30 | 25.00 | 5.00 | 20.00 | |
| | 2020.08.24 | | | | 30.00 (ආ) |
| | 2020.11.11 | 25.00 | | 25.00 | |
| | 2020.11.24 | | | | 30.00 (ආ) |
| | 2020.12.31 | 25.00 | 15.00 | 10.00 | |
| | 2021.02.02 | 25.00 | | 25.00 | 0.00 (ඇ) |
| | 2021.03.25 | 25.00 | 10.00 | 15.00 | |

(අ) මාස දෙකක කාලයක් සඳහා අදාළ වේ.
(ආ) මාස තුනක කාලයක් සඳහා අදාළ වේ.
(ඇ) 2021 පෙබරවාරි 23 දක්වා අදාළ වේ.

| | |
|---|---|
| 2020 ජනවාරි 14 | - තිරිඟු පිටි සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 13ක බදු සහනයක් ලබා දෙන ලද අතර, ඒ සඳහා අදාළ වන බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 3කි. |
| 2020 අප්‍රේල් 10 | - මෝටර් වාහන සඳහා භාවිත කරනු ලබන ආනයනික ලිහිසි තෙල් සඳහා අදාළ වන ආනයන තීරු බද්ද වැඩි කරන ලදී (අංක 2170/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020 අප්‍රේල් 17 | - ආනයනික මාළු නිෂ්පාදන, ජමනාරං, ධාන්‍ය නිෂ්පාදන, පිටි, යුෂ නිෂ්පාදන ඇතුළු එළවළු සහ පලතුරු නිෂ්පාදන, තේ සහ කෝපි නිස්සාරක සහ දුම්කොළ නිෂ්පාදන සඳහා අදාළ වන ආනයන තීරු බද්ද සියයට 25-50 අතර පරාසයකින් වැඩි කරන ලදී (අංක 2171/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020 ජූනි 19 | - අන්තර් අමාත්‍යාංශ කාර්යසාධක බලකාය (කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ) විසින් නිර්දේශ කරන ලද බදු සංශෝධන ක්‍රියාත්මක කරන ලදී.<br>- යකඩ හෝ වානේවලින් නිෂ්පාදනය කළ දුණු සහ දුණු සඳහා කොළ මත වන ආනයන තීරු බද්ද වැඩි කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 22 | - උණ බට ආනයනය මත කිලෝග්‍රෑමයට රුපියල් 300ක ආනයන තීරු බද්දක් පනවන ලදී (අංක 2194/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020 සැප්තැම්බර් 23 | - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත, දේශීය පශු සම්පත් ගොවීන්ට තණකොළ හෝ වෙනත් පැළෑටි වර්ග සපයනු ලබන නිෂ්පාදන ආයතනයක් විසින් ආනයනය කරනු ලබන රේඛීය අඩු ඝනත්ව පොලිතීන් සඳහා සියයට 15ක සාමාන්‍ය තීරු බදු අත් හැරීමක් ලබා දෙන ලදී. |
| 2020 නොවැම්බර් 16 | - සීමාසහිත කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය පහත පරිදි ආනයන බදු ගෙවීමෙන් නිදහස් කරන ලදී (අංක 2202/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය):<br>• 2020 නොවැම්බර් 16 වන දින සිට අවුරුදු 02ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ දී, නිශේධන ලේඛනයේ (negative list) සඳහන් අයිතම හැර ව්‍යාපෘති සමාගමේ ධාරිතාව පුළුල් කිරීම සඳහා අවශ්‍ය වන සියලුම උපකරණ/අමතර කොටස්/උපාංග.<br>• ව්‍යාපෘතිය පුළුල් කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සහ නවීකරණය කිරීම සඳහා අවශ්‍ය වන බැංකු ඇපකර පදනමක් යටතේ 2020 නොවැම්බර් 16ට පෙරාතුව ආනයනය කර ඇති අයිතම. |
| 2020 නොවැම්බර් 18 | - ආනයනය කරන ලද භාණ්ඩ මත වන ආනයන තීරු බද්ද සියයට 0, සියයට 15 සහ සියයට 30 සිට සියයට 0, සියයට 10 සහ සියයට 15 දක්වා සංශෝධනය කෙරිණි. අයිතම 1,440ක පමණ බදු අනුපාතිකය සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී (අංක 2202/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

**සෙස් බද්ද**

| | |
|---|---|
| 2020 ජනවාරි 14 | - තිරිඟු පිටි සඳහා පනවා තිබූ කිලෝග්‍රෑමයට රුපියල් 15ක සෙස් බද්ද ඉවත් කරන ලදී (අංක 2158/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020 මැයි 20 | - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ තිබෙන්නා වූ ඕනෑම අපනයන - අභිමුඛ ව්‍යවසායයන් මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය සහ කොවිඩ්-19 මර්දන මධ්‍යස්ථානය (කොවිඩ්-19 ව්‍යාප්ති මර්දනය සඳහා වන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත සපයනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ සමාන අයිතම, ඔවුන්ගේ ඉල්ලීම මත සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2176/13 දරන අති විශේෂ ගැසට් නිවේදනය).<br>- කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය, ආනයනය සහ සැපයීම සහ ආනයනය සහ පරිත්‍යාග කරනු ලබන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ ඒ හා සමාන භාණ්ඩ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී. කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත බදු නිදහස් කිරීම අදාළ නොවන අතර, මෙම බදු නිදහස් කිරීම 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ (අංක 2176/13 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

පහත අයිතම සඳහා වන සෙස් බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2178/21 දරන අති විශේෂ ගැසට් නිවේදනය, අංක 2182/21 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ අංක 2182/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

| අයිතමය | පැවති බද්ද (සියයට) 2017.11.28 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය (කිලෝග්‍රෑමයට රුපියල්) 2020.06.03 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය (කිලෝග්‍රෑමයට රුපියල්) 2020.07.01 සිට බලපැවැත්වෙන පරිදි |
|---|---|---|---|
| සිමෙන්ති කැට (ක්ලින්කර්ස්) | - | 1.00 | - |
| පෝර්ට්ලන්ඩ් සිමෙන්ති: කෘතිම ලෙස වර්ණ ගැන්වූ හෝ නොග ැන්වූ සුදු සිමෙන්ති | 8.0 | 3.00 | 2.00 |
| දිය කාන්දු නොවන සිමෙන්ති, බොයිලර් සිමෙන්ති සහ ඒවායේ සංයුතික | 8.0 | 3.00 | 2.00 |
| කිලෝග්‍රෑම් 50 සහ ඊට අඩු ඇසුරුම්වලින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 14.0 | 5.00 | 3.00 |
| කිලෝග්‍රෑම් 50 වැඩි ඇසුරුම්වලින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 8.0 | 3.00 | 2.00 |

2020 ජුලි 01 - තෝරාගත් ආනයනික භාණ්ඩ කිහිපයක් මත සෙස් බද්දක් පනවන ලද අතර, තෝරාගත් ආනයනික භාණ්ඩ කිහිපයක් මත පනවා ඇති සෙස් බද්ද ඉහළ නංවන ලදී (අංක 2182/21 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 ඔක්තෝබර් 14 - තෝරාගත් ආනයනික භාණ්ඩ කිහිපයක් මත පනවා ඇති සෙස් බද්ද සංශෝධනය කෙරිණි (අංක 2197/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 නොවැම්බර් 01 - තෝරාගත් ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා පනවා ඇති සෙස් බද්ද සංශෝධනය කෙරුණු අතර, පහත දැක්වෙන භාණ්ඩ සඳහා වන සෙස් බදු අනුපාතිකය අවලංගු කෙරිණි (අංක 2199/21 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ තිබෙන්නා වූ ඕනෑම අපනයන අභිමුඛ ව්‍යවසායයන් මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය සහ කොවිඩ්-19 මර්දන මධ්‍යස්ථානය (කොවිඩ්-19 ව්‍යාප්ති මර්දනය සඳහා වන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත ඔවුන්ගේ ඉල්ලීම මත සපයනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන අයිතම සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.
- රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය කරනු ලබන, ආනයනය කර සපයනු ලබන, ආනයනය කර පරිත්‍යාග කරනු ලබන, කොවිඩ්-19 වසංගත තත්ත්වය මැඩලීම සඳහා වන සෞඛ්‍ය සේවා සැපයීමට අවශ්‍ය වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ, රසායන ද්‍රව්‍ය සහ ඒ හා සමාන භාණ්ඩ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී. කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත බදු නිදහස් කිරීම අදාළ නොවන අතර, මෙම බදු නිදහස් කිරීම 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ.

2020 නොවැම්බර් 18 - තෝරාගත් ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා පනවා ඇති සෙස් බද්ද සංශෝධනය කෙරුණු අතර, ආනයනික භාණ්ඩ කිහිපයක් සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2202/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

| | | |
|---|---|---|
| 2021 මාර්තු 16 | - | ආනයනික භාණ්ඩ කිහිපයක් මත පනවන ලද සෙස් බද්ද සංශෝධනය කෙරිණි (අංක 2219/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2021 මාර්තු 18 | - | 2019 මාර්තු 06 දින හෝ එදිනට පසුව සෑම අදියරකදීම එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි මුදලක් ව්‍යාපෘතියක් මත ආයෝජන කරන, ඕනෑම ව්‍යවසායයක් සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් මගින් එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාල සීමාව හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අතරතුර නමුත් වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2219/36 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද**

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.01.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2159/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.02.02 | බොම්බයි ළූණු, කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ඇපල් (අලුත්), බඩ ඉරිඟු, එළවළු තෙල්, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2160/63 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.02.07 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25ක සිට සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 100ක්, යන දෙකෙන් වැඩි අගය, දක්වා ඉහළ නංවන ලදී (අංක 2161/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.02.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2164/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.03.04 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 150ක්, යන දෙකෙන් වැඩි අගය, දක්වා ඉහළ නංවන ලදී (අංක 2165/12 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.03.08 | මැකරල් මාළු, උඳු, කව්පි සහ කුරක්කන් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2165/73 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.03.13 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) - මත්ස්‍ය ඇම සඳහා භාවිතා කරන මාළු | ධීවර අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව, 2020 මාර්තු මස 04 වැනි දින හෝ ඊට පෙර නැව්ගත කර ඇති බවට නෞභාර පත මගින් සනාථ කෙරේ නම්, ආනයන සඳහා සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 150ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රුපියල් 25ක් අය කරගෙන, ඉතිරි වටිනාකම බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2166/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.03.18 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | ධීවර අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව, 2020 මාර්තු මස 04 වැනි දින හෝ ඊට පෙර නැව්ගත කර ඇති බවට නෞභාර පත මගින් සනාථ කෙරේ නම්, ආනයන සඳහා සියයට 10 හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 150ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රුපියල් 25ක් අය කරගෙන, ඉතිරි වටිනාකම බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2167/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.03.19 | විෂබීජ නාශක සහ මුහුණු ආවරණ | කිලෝග්‍රෑමයට රුපියල් 1ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2167/11 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.03.27 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2168/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.04.10 | එළවළු තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී (අංක 2170/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.04.17 | දොඩම් (අලුත් සහ වියළි), මිදි (අලුත් සහ වියළි), ඇපල්, පෙයාර්ස්, චෙරිස් සහ ප්ලම්ස් හා ස්ලෝස් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී (අංක 2171/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), ලෙමන් (අලුත් සහ වියළි), ක්වින්සස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරිස් (ප්‍රූනුස් සෙරාසස්) සහ නෙක්ටාරින් ඇතුළු පීචස් | මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනවන ලදී (අංක 2171/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | පොල්තෙල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 295ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 195ක් දක්වා අඩු කරන ලදී (අංක 2171/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.05.01 | බොම්බයි ළූණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 15ක් දක්වා වැඩි කරන ලදී (අංක 2173/12 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.05.08 | හාල්මැස්සන්, කරවල, මුං ඇට, මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවිෆෘට් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2174/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.05.22 | යෝගට්, අර්තාපල්, රතු ළූණු, සුදු ළූණු, මෑ වර්ගයේ ඇට (පියලි කළ), කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ලෙමන් (අලුත් සහ වියළි), මිදි (අලුත්), ඇපල් (අලුත්), ක්වින්සස් (අලුත්), මිරිස් (වියළි, කුඩු නොකළ හෝ නොඇඹරූ), බඩඉරිඟු, රටකජු (පොතු හරින ලද), පොල්තෙල් හැර එළවළු තෙල්, මාජරින්, ටින් මාළු, බීට් සහ උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2176/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | දොඩම් (වියළි), මිදි (වියළි) සහ පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2176/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය).. |
| | ජැක් සහ හෝස් මැකරල් මාළු | කිලෝග්‍රෑමයට රුපියල් 150ක් හෝ සියයට 10ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 6ක් දක්වා අඩු කරන ලදී (අංක 2176/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | මෑ වර්ගයේ ඇට (සම්පූර්ණ), මිරිස් (කුඩු කළ හෝ ඇඹරූ), සුදුරූ බීජ, මහදුරු බීජ සහ මුහුණු ආවරණ | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2176/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.06.17 | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 600ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2180/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරිස් (ප්‍රූනුස් සෙරාසස්), චෙරිස් (අනෙකුත්), නෙක්ටාරින් ඇතුළු පීචස්, ප්ලම්ස් සහ ස්ලෝස් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2180/11 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.06.27 | එළවළු තෙල් (පොල්තෙල් හැර), ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී (අංක 2181/23 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ අංක 2181/24 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී (අංක 2181/23 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.07.11 | පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී (අංක 2183/44 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.07.19 | උම්බලකඩ, පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි බීජ, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2184/53 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | උඳු පිටි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 200ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 325ක් දක්වා වැඩි කරන ලදී (අංක 2184/53 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.08.01 | හාල්මැස්සන්, කරවල, මුං ඇට, මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවිෆෲට් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2186/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | බොම්බයි ළූණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 50ක් දක්වා වැඩි කරන ලදී (අංක 2186/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.08.15 | අර්තාපල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 55ක් දක්වා වැඩි කරන ලදී (අංක 2188/50 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.08.22 | ජැක් සහ හෝස් මැකරල් මාළු | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 6ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කරන ලදී (අංක 2189/39 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.09.04 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), මැකරල්, ජැක් සහ හෝස් මැකරල් මාළු, උඳු, කව්පි සහ කුරක්කන් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2191/26 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.10.01 | වෙඬරු, කිරිවලින් නිපදවූ තැවරුම්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, අබ ඇට සහ ලුණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2195/29 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.10.14 | බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), ටින් මාළු, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට ශත 25ක් දක්වා අඩු කරන ලදී (අංක 2197/12 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.10.27 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), කරවල සහ මාලදිවයින් මාළු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී (අංක 2199/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය) |
| | හාල්මැස්සන්, මුං ඇට (මුං), මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවි ෆෲට් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2199/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.11.18 | ටින් මාළු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට ශත 25ක සිට කිලෝග්‍රෑමයකට රුපියල් 100ක් දක්වා වැඩි කරන ලදී (අංක 2202/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.11.22 | යෝගට්, රතු ළූණු, සුදු ළූණු, කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත් සහ වියළි), ලෙමන් (අලුත් සහ වියළි), මිදි (අලුත් සහ වියළි), ඇපල්, ක්වින්සස්, මිරිස් (වියළි, කුඩු නොකළ), මිරිස් (කුඩු කළ හෝ නොඇඹරූ), සුදුරු ඇට, මාදුරු ඇට, බඩ ඉරිඟු, රට කජු (පොතු හරින ලද), මාජරින් සහ මුහුණු ආවරණ | මාස හයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2202/44 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.12.15 | අර්තාපල්, ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස් (ප්‍රූනුස් සෙරාසස්), චෙරීස් (අනෙකුත්), නෙක්ටාරීන් ඇතුළු පීචස්, ප්ලම්ස් සහ ස්ලෝස්, එළවළු තෙල් හා පොල්තෙල් සහ ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | මාස හයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2206/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2020.12.16 | ලුණු | වාණිජමය භාවිතය සඳහා නොවන, ඖෂධ නිෂ්පාදනය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සමඟ ලියාපදිංචි වූ, ඕනෑම ඖෂධ නිෂ්පාදනය කරන ව්‍යාපාර විසින් සිදු කරනු ලබන ලුණු ආනයනය සීමා කිරීම මත කිලෝග්‍රෑමයකට අදාළ වන රුපියල් 40ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රුපියල් 10ක් එකතු කිරීමෙන් පසු ඉතිරි අගය ඉවත් කරන ලදී (අංක 2206/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.01.14 | බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සහ උක් සීනි, සීනි (එකතු කළ රසගන්වනය හෝ වර්ණකාරක දෑ අඩංගු) සහ සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ බීට් සීනි | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2210/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2021.01.19 | පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි බීජ, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්), උඳු පිටි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී. (අංක 2211/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2021.02.12 | හාල්මැස්සන් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 1ක සිට කිලෝග්‍රෑමයකට රුපියල් 100ක් දක්වා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කරන ලදී (අංක 2214/58 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | කරවල, අර්තාපල් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කරන ලදී (අංක 2214/58 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2021.03.04 | මැකරල්, ජැක් හෝ හෝස් මැකරල් මාළු, උඳු, කව්පි, මෙනේරි සහ කුරක්කන් | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කරන ලදී (අංක 2217/23 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

**වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද**

2020 පෙබරවාරි 25 - සිමෙන්ති කැට (ක්ලින්කර්) සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10ක සිට සියයට 7.5ක් දක්වා අඩු කරන ලදී (අංක 2164/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 අප්‍රේල් 16 - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත පරිත්‍යාගයක් ලෙස භාර දී ඇති, සෞඛ්‍ය උපකරණ හා උපාංග සහ රෝහල් ගෘහ උපකරණ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2171/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 අප්‍රේල් 23 - වාහනේ කර්මාන්තය සඳහා අදාළ වන අමුද්‍රව්‍ය ආනයනය සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10ක සිට සියයට 5ක් දක්වා අඩු කරන ලදී (2172/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 මැයි 19 - සුදුසුකම් ලත් ඕනෑම අපනයන අභිමුඛ ව්‍යවසායයන් මගින් සපයනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන අයිතම වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2176/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

- කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය, ආනයනය සහ සැපයීම, ආනයනය සහ පරිත්‍යාග කරනු ලබන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ, රසායනික ද්‍රව්‍ය හා ඒ හා සමාන භාණ්ඩ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත බදු නිදහස් කිරීම් අදාළ නොවන අතර මෙම බදු නිදහස් කිරීම 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ (අංක 2176/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 මැයි 26 - ඖෂධ නිෂ්පාදකයන් විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2177/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 සැප්තැම්බර් 03 - තෝරාගත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය සඳහා අදාළ වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 5ක සිට සියයට 2.5ක් දක්වා අඩු කරන ලදී (අංක 2191/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 ඔක්තෝබර් 24 - රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව, ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමනය යන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, ඖෂධ නිෂ්පාදනය සඳහා ඖෂධ නිෂ්පාදකයන් විසින් ආනයනය කරන ලද ඖෂධ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා උපාංග සහ අමතර කොටස් ඇතුළු ඖෂධ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කෙරිණි (අංක 2198/57 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 ඔක්තෝබර් 27 - ඕනෑම නියෝජිත ආයතනයකින් ආනයනික හෝ ආනයනික සහ සපයන ලද, සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන පරීක්ෂණ කට්ටල ඇතුළු වෛද්‍ය උපකරණ සහ ආම්පන්න වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කෙරිණි (අංක 2199/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 නොවැම්බර් 30 - ඕනෑම නියෝජිත ආයතනයක් විසින් ආනයනික හෝ ආනයනික සහ සපයන ලද, මුහුණු ආවරණ නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද, 5603.91.00, 5607.90.90 සහ 3916.10.00 යන HS කේත අංක යටතේ වර්ග කරන ලද, නොවියන ලද රෙදි වර්ග, කන් ලූප සහ නාස් සම්බන්ධක වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කෙරිණි (අංක 2203/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

- යකැටිති (අර්ධ අවසන් යකඩ හෝ මිශ්‍ර වානේ නොවන නිෂ්පාදන සඳහා වන HS කේතය යටතේ) මත පැන වූ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 5ක සිට සියයට 2.5ක් දක්වා අඩු කෙරිණි (අංක 2203/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

- සුවඳ විලවුන් සහ සුවඳ ජලය, අලංකරණ හෝ රූපලාවන්‍ය සැකසුම් සහ සමෙහි රැකවරණය සඳහා සැකසුම්, හිසකෙස්වල භාවිතය සඳහා සැකසුම් (රන් හා රිදී නොවන), ආභරණ හා ඇස් කණ්ණාඩි, ආරක්ෂණ කණ්ණාඩි සහ ඊට සමාන, නිවැරදි කිරීමේ, ආරක්ෂාකාරී හෝ අනෙකුත් දෑ ඇතුළු බොහෝ අයිතම මත වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සංශෝධනය කෙරිණි (අංක 2203/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2021 පෙබරවාරි 23 - කිරි සහ සීනි හෝ අනෙකුත් පැණි රසකාරක එක් කරන ලද (HS කේත අංක 0402.10.00, 0402.21.00, 0402.29.00 යටතේ එන නිෂ්පාදන) නැතහොත් සාන්ද්‍රික යොදය මත පැන වූ වරාය සහ ගුවන් තොටුපළ බද්ද සියයට 10 සිට සියයට 2.5ක් දක්වා අඩු කෙරිණි (අංක 2216/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 09 - 2008 අංක 14 දරන වාණිජ කේන්ද්‍රස්ථාන රෙගුලාසි සහ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති (SDP) පනත යටතේ අනුමත වූ ඕනෑම ව්‍යාපෘතියක් හැරුණු කොට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති, සෑම අදියරදීම එ.ජ. ඩොලර් මිලියන 50කට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කරන එවැනි ව්‍යාපාරවල ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන අතර හෝ වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, එම ව්‍යාපෘතීන්ට අදාළව ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

2021 මාර්තු 20 - රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, ඛනිජ තෙල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, විශේෂයෙන් තාර නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ආනයනය කරන ලද උඳුන් තෙල්, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

**අනෙකුත් බදු සහ අයබදු**

2020 ජනවාරි 01 - ණය ආපසු ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී (2020 අංක 2 දරන මුදල් (සංශෝධන) පනත).

2020 මාර්තු 23 - 2020 පළමු කාර්තුවට අදාළව, 2020 අප්‍රේල් 15 වන දිනට ගෙවීමට නියමිතව තිබූ මුද්දර ගාස්තු ගෙවීම් 2020 අප්‍රේල් 30 දින දක්වා සිදු කිරීමට අවසර ලබා දෙන ලදී (දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/SD/2020-01).

2020 ඔක්තෝබර් 01 - අපගමන බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගය | පෙර පැවති ගාස්තුව 2020.02.01 සිට බලපැවැත්වෙන පරිදි | සංශෝධිත ගාස්තුව 2020.10.01 සිට බලපැවැත්වෙන පරිදි |
|---|---|---|
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (MRIA) සිට ගුවන් යානයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන පුද්ගලයන් | එ.ජ. ඩොලර් 60 | නොමිලේ (අ) |
| කොළඹ - රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ගුවන් යානයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන පුද්ගලයන් | එ.ජ. ඩොලර් 60 | එ.ජ. ඩොලර් 30 (ආ) |

(අ) 2020.10.01 - 2022.09.30 යන කාලය සඳහා අදාළ වේ.

(ආ) 2020.10.01 - 2021.09.30 යන කාලය සඳහා අදාළ වේ.

2021 ජනවාරි 01 - සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝටල් බලපත්‍ර (FL/7) සහ කාමර 5 හෝ ඊට වැඩි, සංචාරක මණ්ඩලයේ අනුමැතිය නොලත් හෝටල් සඳහා හෝටල් තැබෑරුම් බලපත්‍ර (FL/8), ආපනශාලා බලපත්‍රය (සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත්/අනුමැතිය නොලත් ආපනශාලා සඳහා) (FL/11), විවේකාගාර බලපත්‍රය (FL/12) සහ ස්ථානවල දී පරිභෝජනයට (FL/22B), (සංචාරක මණ්ඩලය විසින් අනුමැතිය ලත්/අනුමැතිය නොලත් ස්ථාන සඳහා) වාර්ෂික මද්‍යසාර බලපත්‍ර ගාස්තු ඉවත් කරන ලදී (අංක 2208/35 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

**අනෙකුත්**

2020 ජූලි 15 - මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වන කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) සඳහා බදු සහන කිහිපයක් ලබා දෙන ලදී (අංක 2184/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 නොවැම්බර් 10 - කොළඹ 10, ඩී.ආර්. විජේවර්ධන මාවතෙහි පිහිටි ඉහළ අන්තයේ පිහිටි සාප්පු සංකීර්ණ, ඉහළ තත්ත්වයේ නිවාස හා ආශ්‍රිත පහසුකම් සහිත කාර්යාල අවකාශ/ සේවා අවකාශ ඇතුළු කාමර 400කින් සමන්විත, සුපිරි සුඛෝපභෝගී සංචාරක නිවාඩු නිකේතනයක් පිහිටු වීමට සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා අංක 1841/4 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙන් ලබා දුන් බදු සහන අවලංගු කරන ලදී (අංක 2201/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 05 - හම්බන්තොට ජාත්‍යන්තර වරායෙන් අතුරු බදු දීමට නියමිත භූමියෙහි අපනයන වෙළඳපොළ සඳහා අර්ධ වානේ රේඩියල් ටයර් සහ සම්පූර්ණ වානේ රේඩියල් ටයර් (ට්‍රක් රථ සහ බස් රථ රේඩියල් ටයර් (TBR), මගී මෝටර් රථ රේඩියල් ටයර් (PCR) නිෂ්පාදන කිරීමේ ව්‍යාපෘතිය සඳහා බදු සහන කිහිපයක් ලබා දෙන ලදී (අංක 2209/21 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

- "ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා වෙන් කළ කලාපයක්" තුළ පිහිටුවීමට නියමිත පෞද්ගලික ව්‍යවසායයන් සඳහා බදු සහන කිහිපයක් ලබා දෙන ලදී (අංක 2209/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

**රාජ්‍ය වියදම**

2020 ජනවාරි 08 - 2020 යල කන්නය ආරම්භයේ සිට වී වගා කරන ගොවීන් සඳහා, උපරිමය හෙක්ටයාර 02කට යටත්ව, යූරියා, ත්‍රිත්ව සුපිරි පොස්පේට් (T.S.P.) සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MoP) යන පොහොර වර්ගවල නිර්දේශිත ප්‍රමාණයන් නොමිලේ ලබා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී.

2020 පෙබරවාරි 14 - ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් හා සහාය දීම සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාව පිහිටුවන ලදී (අංක 2162/64 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 ජූනි 19 - 2020 මැයි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව අවුරුදු හැට එකක් දක්වා දීර්ඝ කරන ලදී (අංක 2180/35 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

2020 අගෝස්තු 28 - 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වන කාලය සඳහා රුපියල් බිලියන 1,748ක අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

2020 සැප්තැම්බර් 02 - උපාධිධාරීන් සහ අඩු ආදායම්ලාභී පවුල්වලින් නුපුහුණු පුද්ගලයින් බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

2020 සැප්තැම්බර් 11 - රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් සිදු කරනු ලබන අනුග්‍රහ දැක්වීම්, පරිත්‍යාග කිරීම් සහ දන්වීම් පළ කිරීම් වැනි ආයතනික සමාජ වගකීම් පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා පනවා තිබූ තාවකාලික තහනම ඉවත් කරන ලදී.

2020 නොවැම්බර් 20 - 2020 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

2020 දෙසැම්බර් 10 - 2021 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

**රාජ්‍ය ණය කළමනාකරණය**

2020 මාර්තු 29 - සතිපතා සිදු කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල පැන නගිනු ලබන අඩුපාඩු ආවරණය කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත් දායකත්ව මුදල් සැපයීම සඳහා පහසුකම් සැලසීමට මුදල් මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම විධානය මේ දක්වා ක්‍රියාත්මක වේ.

2020 අප්‍රේල් 06 - භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය දින 364 පරිණත කාලයට පමණක් ප්‍රකාශයට පත් කිරීමට හා දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා වන ඵලදා අනුපාතික දින 364 සඳහා තීරණය වන ඵලදා අනුපාතිකයට අනුකූල වන පරිදි තීරණය කිරීමට අදාළ පියවර ගන්නා ලදී.

2020 මැයි 06 - භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලදී සියලු පරිණත කාලයන් සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කරන ලදී.

- භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි ක්‍රමයේ තුන්වන අදියර ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නවතා දමන ලදී.

2020 දෙසැම්බර් 09 - 2021 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි ද්විතීයික වෙළඳපොළෙහි රජයේ සුරැකුම්පත් ගනුදෙනුවලට අදාළ තොරතුරු පොදු යොමු අංක ආකෘතියක් යටතේ වාර්තා කිරීම සහ ගනුදෙනුව තහවුරු වී මිනිත්තු 30ක් ඇතුළත ලංකාසෙක්‍යු පද්ධතිය වෙත යොමු කිරීම මගින් තොරතුරු වාර්තා කිරීමේ කටයුතු කාර්යක්ෂමව, ඵලදායීව සහ නිවැරදිව සිදු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. කෙසේ වෙතත්, වෙළඳපොළේ ගනුදෙනු වාර්තා කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, ගනුදෙනු මිනිත්තු 30ක් ඇතුළත වාර්තාකරණ අවශ්‍යතාවය 2021 ජනවාරි මාසයේ දී අවලංගු කරන ලදී.

2021 ජනවාරි 26 - වෙළඳපොළ යථා තත්ත්වයට පත්ව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළේ අරමුදල් රැස් කිරීම රජයට හිතකර වන තෙක් භාණ්ඩාගාරයට අවශ්‍ය විදේශ අරමුදල් සම්පාදනය කිරීම පහසු කිරීම සඳහා ඇපකර අරමුදල් සම්පාදනය සහ/හෝ විදේශ මුදල් මූලාශ්‍ර තත්ත්වයන් මත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු ක්‍රමය යටතේ බැංකු සඳහා නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

2021 පෙබරවාරි 03 - භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය දින 364 පරිණත කාලයට පමණක් ප්‍රකාශයට පත් කිරීමට හා දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා වන ඵලදා අනුපාතික දින 364 සඳහා තීරණය වන ඵලදා අනුපාතිකයට අනුකූල වන පරිදි තීරණය කරන ලද අතර සියලුම භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාලයන් සඳහා වෙන්දේසියේ දී පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතික ප්‍රකාශයට පත් කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

2021 මාර්තු 26 - ද්විතියික වෙළඳපොළෙහි වෙළඳ භාවිතයන් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම, වෙළඳාමේ විශ්වාසනීයභාවය ඉහළ නැංවීම සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව සහ විශ්වාසය වැඩි කිරීම යන අරමුණු සහිතව ද්විතියික වෙළඳපොළෙහි සිදු වන සියලුම රජයේ සුරැකුම්පත් ගනුදෙනු, එම ගනුදෙනු සිදු කරන දිනයේදී ම වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, ලංකා සෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් විසින් සිදු කරන සියලුම ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කිරීම, 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක විය.